සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

වාර්ෂික වාර්තාව
2017

27, මෙල්බෝර්න්, ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 523 258 ෆැක්ස්: +94 11 250 0674
ඊමේල්: infosugarsrilanka@gmail.com



කිතුල් වීලයකට
නැවුම් බලාපොරොත්තුවක්



සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

පටුන

සමාගමේ දළ විශ්ලේෂණය	5
අපගේ දර්ශනය, අපගේ දැක්ම, අපගේ අරමුණු, උපාය මාර්ග පර්යේෂණ සහ සංවර්ධන, ආයතනික සමාජයීය වගකීම	6
මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂී අවස්ථා	8
සභාපතිතුමාගේ සමාලෝචනය	10 - 11
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය	12
අධ්‍යක්ෂ මණ්ඩලය	14 - 15
ආයතනික පාලනය	16 - 17
අවදානම් කළමනාකරණ සමාලෝචනය	18
අපගේ සංස්කෘතිය සහ සාරධර්ම	20 - 21
විගණන කමිටු වාර්තාව	22
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ සංවිධාන ව්‍යුහය	24 - 28
විගණන වාර්තාව	30 - 32
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	33
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	34
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	35
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	36
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	37 - 59
ආංශික මූල්‍ය තොරතුරු - පැල්වත්ත සහ සෙවනගල ඒකක	60 - 67
ප්‍රස්තාරමය ආංශික සැසඳීම - පැල්වත්ත සහ සෙවනගල ඒකක	68 - 71
ප්‍රගති වාර්තාව	72 - 73
ආයතනික තොරතුරු	74

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

සමාගමේ දළ විශ්ලේෂණය

මහා භාණ්ඩාගාරයේ ලේකම් ස්වර්ණමය කොටස් හිමිකරු වන, කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය විසින් පත්කරන ලද සභාපතිවරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් පාලනය කරනු ලබන සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද රාජ්‍ය ව්‍යාපාරයක් වේ. ශ්‍රී ලංකාවේ විශාලතම සීනි නිෂ්පාදකයා වන සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් රටේ වාර්ෂික සීනි අවශ්‍යතාවයෙන් 8% ක් නිෂ්පාදනය කරනු ලබන අතර, රටේ එතනෝල් අවශ්‍යතාවයෙන් 37% ක් සපුරාලනු ලැබේ.



සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

අපගේ දර්ශනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීම තුළින් ජාතික සංවර්ධනයට දායක වීම සහ එමඟින්, සීනි මත පදනම් වූ ගොවිතැන සහ කර්මාන්ත ආශ්‍රිත ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය උසස් කිරීම.

අපගේ දැක්ම

දේශීය සීනි සැපයුමෙන් ස්වයංපෝෂිත වීම

අපගේ අරමුණු

මෙහෙවර 333- කෙටිකාලීන (2020 තෙක් වසර 3 කට)

- මෙට්‍රික් ටොන් 50,000 ක සීනි නිෂ්පාදනයක් ළඟා කරගැනීම
- ගොවි පවුල් 15,000 ක් සඳහා සහාය දැක්වීම
- වක්‍ර රැකියා 50,000 ක් සැපයීම
- ගොවි පවුලක මාසික ශුද්ධ ආදායම රු. 35,000 දක්වා වැඩි කිරීම
- ජාතික සීනි අවශ්‍යතාවයට 15% ක දායකත්වයක් ලබාදීම
- රුපියල් බිලියන 1 ක ශුද්ධ ලාභයක් ලබාගැනීම
- රුපියල් බිලියන 15 ක විදේශ විනිමය ඉතිරි කරගැනීම
- සමගාමීව මෙගා වොට් 45 ක විදුලි බලයක් උත්පාදනය කිරීම

මෙහෙවර 555 - දිගු කාලීන (2022 තෙක් වසර 5 කට)

- මෙට්‍රික් ටොන් 75,000 ක සීනි නිෂ්පාදනයක් ළඟා කරගැනීම
- ගොවි පවුල් 20,000 ක් සඳහා සහාය දැක්වීම
- වක්‍ර රැකියා 60,000 ක් සැපයීම
- ගොවි පවුලක මාසික ශුද්ධ ආදායම රු. 35,000 දක්වා වැඩි කිරීම
- ජාතික සීනි අවශ්‍යතාවයට 40% ක දායකත්වයක් ලබාදීම
- රුපියල් බිලියන 2 ක ශුද්ධ ලාභයක් ලබාගැනීම
- රුපියල් බිලියන 20 ක විදේශ විනිමය ඉතිරි කරගැනීම
- සමගාමීව මෙගා වොට් 60 ක විදුලි බලයක් උත්පාදනය කිරීම

උපාය මාර්ග

- දෙපාර්ශ්වයටම අර්ථලාභී භවුල් ව්‍යාපාරයක් සඳහා අප වගාකරු පදනම් කරගත් වගා ආකෘතිය.
- ඉහළ ඵලදාවක් ගෙනදෙන ප්‍රභේදයන් සහිතව ඵලදාව වැඩිදියුණු කිරීම, කාර්යක්ෂම ව්‍යාප්ති සේවාවක් සහිත මනා කෘෂිකාර්මික පිළිවෙත් සහ ගොවීන්ට වඩා හොඳ ප්‍රතිලාභයන් ලබාදීම.
- ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදායීතා දිරිගැන්වීම් මඟින් ගොවීන් අභිප්‍රේරණය කිරීම.
- ඵලදායීතාව සහ කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීම් මඟින් කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

පර්යේෂණ සහ සංවර්ධන

උක් සහ සීනි ඵලදායීතාව වැඩිකිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය සමඟ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් සිටී.

ආයතනික සමාජයීය වගකීම

අප විසින් උක් ගොවීන්ගේ ආදායම් අගයන් වැඩිකර, අප ක්‍රියාත්මක වන පරිසරය සහ ප්‍රජාව සඳහා අගයන් එකතු කළ යුතු බව අපගේ විශ්වාසයයි.



සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂී අවස්ථා - 2017

සංඛ්‍යා රුපියල් මිලියන වලින් දැක්වේ	2016	2017
මූල්‍යමය සුවිශේෂී අවස්ථා		
පිරිවැටුම	7,728.89	7,616.94
විකුණුම් පිරිවැය	(5,547.83)	(6,102.70)
දළ ලාභය	2,181.06	1,514.24
බදුවලට පෙර ශුද්ධ ලාභය	1,006.29	402.70

මෙහෙයුම් කාර්යසාධනය	2016	2017
වගා භූමි		
වගා කළ හැකි භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	17,499	14,265
වගා කළ භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	13,022	12,622
වගා කළ භූමි ප්‍රමාණයේ ප්‍රතිශතය (%)	74%	88%

අස්වනු නෙලීමේ ව්‍යාපෘතිය	2016	2017
ලබාගත් උක් දණ්ඩ අස්වැන්න - මෙට්‍රික් ටොන්	651,094	589,139
පසුගිය වසරේ වැඩිවීමේ/ (අඩුවීමේ) ප්‍රතිශතය	16%	-9.52%
සීනි නිස්සාරණය කිරීමේ අනුපාතය	7.90%	7.27%

සීනි නිෂ්පාදනය	2016	2017
නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	51,422	42,822
ඒක පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	10.49%	9

මානව සම්පත්	2016	2017
ස්ථිර	1,429	1,351
කොන්ත්‍රාත්	1,176	1,232
අනියම්	1,731	2,131
කන්නමය වශයෙන්	527	-
පුහුණුවන්නන්	37	111
මුළු ගණන	**4,900**	**4,825**





සභාපතිතුමාගේ සමාලෝචනය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

සමාලෝචිත වර්ෂය තුළදී, උක් දඬු ඵලදාව (හෙක්ටයාරයකට ඵලදාව) මෙන්ම සීනි නිස්සාරණය කිරීමේ අනුපාතය කෙරෙහි අහිතකර ලෙස බලපෑන ලද අයහපත් දේශගුණික තත්ත්වයන් ඇතුළත් අභියෝග රාසකට මුහුණපෑමට සමාගමට සිදු වූ අතර, පෙර වර්ෂය හා සැසඳීමේදී අස්ථාවර ආර්ථික තත්ත්වයන් යටතේ වර්ෂය තුළදී සීනි නිෂ්පාදනයෙහි සැලකිය යුතු පහත වැටීමක් වාර්තා විය. එහෙත්, සමාගම ඒවා අවම කර ගැනීමට කළමනාකරණය කර වර්ෂය තුළදී රු. මිලියන 402 ක බදුවලට පෙර ලාභයක් ලබාගෙන ඇති අතර, එය පෙර වර්ෂය හා සැසඳීමේදී 60% ක පහත වැටීමකි.

ආර්ථික වාතාවරණය

2016 දී 4.5% ක් වූ ශ්‍රී ලංකාවේ සැබෑ ආර්ථික වර්ධනය හා සැසඳීමේදී 2017 වර්ෂයේදී එය 3.1% ක් ලෙස වාර්තා වේ. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අපනයන වෙළෙඳපොල සඳහා පවත්නා ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමී වීම අපනයන අංශයේ වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ අතර, ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් වීම කෙටිකාලීන ප්‍රාග්ධන පිටතට ගලායාමට ඉවහල් විය. මෙම වර්ධනයන්ගේ බලපෑම ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩවල අවම මිල ගණන් මඟින් තරමක් දුරට අඩු කරන ලදී. එසේ වුවද, විශේෂයෙන් රාජ්‍ය අංශයේ සේවකයින් අතර, ආදායම් වර්ධනය වීමත් සමඟ ගෘහස්ථ පාරිභෝජනය යළිත් වර්ධනය විය. 2017 වර්ෂයේදී ආර්ථිකයේ මුළු අංශ තුනම සැබෑ ආර්ථික වර්ධනය සඳහා දායකත්වය ලබා දී ඇත.

2017 වර්ෂය තුළදී කෘෂිකර්ම සහ සේවා ආශ්‍රිත කටයුතු පිළිවෙලින් 0.8% කින් සහ 3.2% කින් වර්ධනය වූ අතර, කර්මාන්ත ආශ්‍රිත කටයුතු 3.9% කින් වර්ධනය විය. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.දර්., 2013 - 100) වාර්ෂික වෙනස අනුව මනිනු ලැබ ඇති පරිදි උද්ධමනය, 2016 වර්ෂයේදී පැවති 3.1% හා සැසඳීමේදී 2017 වර්ෂයේදී 11.3% ක ඉහළ අනුපාතයකින් වැඩි වී ඇත.

කර්මාන්ත දළ විශ්ලේෂණය

පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්, පෙර වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී සීනි කර්මාන්තය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. 2016 වර්ෂය හා සැසඳීමේදී 16.72% ක පහත වැටීමක් සහිතව මෙම වර්ෂය තුළදී සීනි මෙ.ටො. 42,822 ක් නිෂ්පාදනය කිරීමට සමාගමට හැකි වූ අතර, එය දේශීය සීනි අවශ්‍යතාවයෙන් 7% ක් වේ. තවද, එය දේශීය සීනි නිෂ්පාදනයෙන් 86% කි.

පෙර වර්ෂ හා සැසඳීමේදී 2016 වර්ෂයේදී පැවති අතිරික්ත සීනි නිෂ්පාදනය සහ ආනයනයන් හේතුකොට ගෙන ගෝලීය වශයෙන් සීනි මිල ගණන් තියුණු ලෙස පහත වැටී තිබුණු අතර, සීනි නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ඔවුන්ගේම ස්වාරක්ෂක තොග පවත්වාගෙන ගොස් තිබුණි. මෙය වෙළෙඳපොලෙහි විකුණුම් මිල ගණන් පහත වැටීමට හේතු වූ අතර, අප විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වලට සීනි මිලදී ගැනීමට ප්‍රධාන තොග වෙළෙඳුන් අකමැති විය. එහෙත්, පසුව රජය විසින් ආනයනික සීනි මත පැනවෙන සෙස් බද්ද වැඩිකරන ලද අතර, වසරේ අවසන් භාගයේදී සීනි සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 100/-ට ඉහළ වඩා හොඳ තොග මිල ගණන් ලබාගැනීමට සමාගමට හැකි විය.

සමාගමේ කාර්යසාධනය

පෙර වර්ෂයේදී වාර්තා වූ රු. මිලියන 7,728 ක ආදායම හා සැසඳීමේදී, සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළදී සමාගම විසින් රු. මිලියන 7,616 ක ආදායමක් වාර්තා කරන ලදී. 2017 වර්ෂය තුළදී සමාගම විසින් රු. මිලියන 402 ක බදුවලට පෙර ලාභයක් වාර්තා කරන ලද අතර, එය 2016 වර්ෂය හා සැසඳීමේදී 60% ක පහත වැටීමකි. 2016 වර්ෂයේදී මෙ.ටො. 51,422 ක් වූ සීනි නිෂ්පාදනය 2017 වර්ෂය තුළදී මෙ.ටො. 42,822 ක් දක්වා අඩු වී ඇත. 2016 වර්ෂයේදී ලීටර් 11,917,279 ක් වූ ENA නිෂ්පාදනය 2017 වර්ෂයේදී ලීටර් 7,045,223 ක් දක්වා අඩු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය තුළදී ආදායම රු. මිලියන 113 කින් අඩු වී ඇත. එහෙත්, රු. මිලියන 555 ක් වූ විකුණුම් පිරිවැයෙහි 10% ක වැඩිවීම හේතුකොට ගෙන බදුවලට පෙර ලාභය කෙරෙහි ඍණාත්මකව බලපා ඇති අතර, එය රු. මිලියන 604 කින් අඩු වී ඇත. වර්ෂය තුළදී මූල්‍ය පිරිවැය රු. මිලියන 48 කින් වැඩිවී ඇති අතර, මූල්‍ය ආදායම රු. මිලියන 50 කින් වැඩි වී ඇත. වර්ෂය තුළදී ශුද්ධ ලාභය තියුණු ලෙස පහත වැටීම කෙරෙහි සාර්ව සහ ක්ෂුද්‍ර පාරිසරික සාධකවලට අමතරව, මෙම සියළු සාධක බලපා ඇත.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

සුභසාධනය

වර්ෂය තුළදී සමාගම විසින් සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් සුභසාධනය සඳහා යොදවනු ලැබීය. නඩත්තු කාර්ය මණ්ඩලයේ වෙනම කණ්ඩායමක් දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වෙන්කර ඇත. තවද, සේවක පවුල්වල පාසැල් ළමුන් සහ කුඩා දරුවන් මෙන්ම සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පවුල්වල සාමාජිකයින් සඳහා සමාගම විසින් ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ. මීට අමතරව, රැකියාවේ ගුණාත්මකභාවය සහ අප සේවකයින්ගේ තිරසාරභාවය තහවුරු කිරීම පිණිස සමාගම විසින් පෙර පාසැලක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සහ වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලැබේ.

අනාගත අපේක්ෂාව

ශ්‍රී ලංකා ආර්ථිකය වේගයෙන් ඉදිරියට ගමන් කරමින් සිටින අතර, එහි සංවර්ධන ඉලක්කයන් සපුරාගත හැකි වේ යැයි අපේක්ෂා කෙරේ. රජයේ ප්‍රතිපත්ති සහ පොලී අනුපාත පහත වැටීම නව ආයෝජන විකල්ප සොයා බැලීමට අපව යොමුකරමින් සිටියි. අපගේ නිෂ්පාදන සඳහා නිශ්චිත වෙළෙඳපොලක් පවතී. උක් වගා භූමි ප්‍රමාණය වැඩි කිරීම කෙරෙහි කළමනාකරණය අඛණ්ඩව අවධානය යොමු කරමින් සිටියි. වඩා හොඳ ප්‍රතිඵල ලබාගැනීම සඳහා දැනට සිටින ගොවීන් අභිප්‍රේරණය කිරීම මෙන්ම, නව ගොවීන් කර්මාන්තය වෙත රැගෙන ඒම අවශ්‍ය වේ. නව ඉඩම් අත්පත් කරගැනීම සහ අපගේ වගාවන්වල ඵලදායීතාව වැඩි කිරීම ද වැදගත්ය. ප්‍රධාන නිෂ්පාදනයට අමතරව, මෙහෙයුම්වල උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අතුරු නිෂ්පාදන බිහිකිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමින් සිටින්නෙමු.

ඇගයීම

වර්තමානයේදී සහ අතීතයේදී දරන ලද අමිල ප්‍රයත්නය සහ ලබාදෙන ලද දායකත්වය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට, සමාගමේ කළමනාකාරීත්වයට සහ කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පළකිරීමට කැමැත්තෙමි. තවද, අඛණ්ඩව සමාගම සමඟ රැඳී සිටීම වෙනුවෙන් උක් ගොවීන්ට, පාරිභෝගිකයින්ට, සීනි තොග වෙළෙඳුන්ට සහ බැංකු සහ අනෙකුත් රජයේ ආයතනයන්ට ද මාගේ ස්තුතිය පළකරමි. අවසාන වශයෙන්, එහෙත් අවම වශයෙන් නොව, මා හට සහාය දක්වන්නා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට සහ සමාගම ජයග්‍රහණය කරා රැගෙන යෑමට මඟපෙන්වන්නා වූ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මාගේ ස්තුතිය පිරිනමමි.

නවීන් අදිකාරම
සභාපති



අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

"අසාර්ථකවීම්, නැවත නැවත අසාර්ථකවීම් ජයග්‍රහණය කරා යන ගමනේ මංසළකුණු වේ. සාර්ථකත්වය කරා යන ගමනේ ඉදිරියටම යන්නේ අසාර්ථකවන්නාය."

සී.එස්. ලෙවිස්

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අපගේ භැඟීම වන්නේ, වඩා හොඳ නිෂ්පාදන සැපයීම සඳහා රටේ විශාලතම සීනි සහ එතනෝල් සැපයුම්කරු වීමේ අපගේ ශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම සහ හොඳම අදහස්, උපායමාර්ග සමඟ වේගයෙන් වැඩි කැපවීමකින් සහ මනා පුහුණු ශ්‍රම බලකායකින් සාර්ථකත්වය ළඟාකර ගැනීමයි.

අපගේ තාක්ෂණික දැනුම, ලොව නවීනතම තාක්ෂණය සහ විවිධාංගීකරණය යොදාගනිමින් ඵලදායීතා මට්ටම් ඉහළ නැංවීමෙන් සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා හොඳම දේ කළහැකි බව අපි දනිමු. ජාතියේ සීනි නිෂ්පාදකයා වශයෙන් කරන ලද නොනිමි කැපවීම තුළින්, 2017 මූල්‍ය වර්ෂය සඳහා මාගේ සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මට ඉමහත් සතුටක් ගෙන දේ. 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ අඛණ්ඩව අලාභ ලැබීමෙන් අනතුරුව, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම කළමනාකරණයේ කැපවීම තුළින් 2016 සහ 2017 වර්ෂවලදී ලාභ ලැබීම ආරම්භ කර ඇති අතර, ක්‍රියාත්මක කරන ලද උපායමාර්ග තුළින් 2016 සහ 2017 වර්ෂවලදී ඵලදායීතාවය ඉහළ නැංවීමටත්, දුඹුරු සීනි සහ එතනෝල් සඳහා වඩා හොඳ මිලක් ලබාගැනීමටත් හැකි විය.

වඩාත් විශේෂයෙන්, 2017 වර්ෂයේදී සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම සුවිශේෂී වර්ධනයක් පෙන්වා ඇති අතර, 2012 සිට ස්වයං මූල්‍යනයෙන් ලාභ උපයන රජයට අයත් ව්‍යාපාරයක් ලෙස පැවතීමේ වසර 05 ක් සම්පූර්ණ කිරීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් පසුකර ඇත.

මූල්‍ය සමාලෝචනය

2015 දෙසැම්බර් සිට නවීන් අදිකාරම මහතා විසින් සභාපතිත්වය දරනු ලබන වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් රු. බිලියන 7.6 ක ආදායමක් සහ රු. මිලියන 402 ක බදුවලට පෙර ලාභයක් වාර්තා කරන ලදී. 2016 මූල්‍ය වර්ෂය තුළදී, කළමනාකරණය විසින් සමාගමෙහි ප්‍රතිසැලසුම්කරණ ක්‍රියාවලියක් භඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස, 2016 වර්ෂයේදී බදුවලට පෙර ලාභය රු. බිලියන 1 ක් වූ අතර, එම වසරේදී රු. බිලියන 7.7 ක ආදායමක් වාර්තා කරන ලදී. 2017 වර්ෂයේදී බදුවලට පෙර ලාභය රු. මිලියන 402 ක් වූ අතර, රු. බිලියන 7.6 ක ආදායමක් වාර්තා කරන ලදී.

මෙහෙයුම් සමාලෝචනය

2017 වර්ෂය තුළදී, සමාගම විසින් දුඹුරු සීනි මෙ.ටොං. 42,822 ක් නිපදවා ඇති අතර, එය 2016 වර්ෂය හා සැසඳීමේදී 17% ක පහත වැටීමකි. තවද, 2017 වර්ෂයේදී එතනෝල් කිලෝ ලීටර 7,045,223 ක් නිපදවීමට සමාගමට හැකියාව ලැබුනු අතර, 2016 වර්ෂය හා සැසඳීමේදී එය එතනෝල් නිෂ්පාදනයෙහි 40% ක පහත වැටීමකි. එහෙත්, මෙය ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයෙහි ස්වර්ණමය යුගයක ආරම්භය වේ.

සමාප්තිය

ජයග්‍රහණය ළඟා කරගනු වස් 2017 වර්ෂය තුළදී ලබාදුන් මඟපෙන්වීම සහ දැක්වූ සහාය වෙනුවෙන් අපගේ සභාපති නවීන් අදිකාරම, අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාවය පළකර සිටින්නෙමි.

එම්.එස්.එම්. ෆවුසර්
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී



සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

අධ්‍යක්ෂ මණ්ඩලය

අපගේ සභාපති

නවීන් අදිකාරම මහතා - විද්‍යාවේදී උපාධිය, මධ්‍යම මිසූරි ප්‍රාන්ත විශ්ව විද්‍යාලය, කැන්සාස් නගරය, මිසූරි, ඇමරිකා එක්සත් ජනපදය

ආයතනික යහපාලනය, ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආක්‍රීය රාජ්‍ය ව්‍යවසාය පුනරුදය කිරීම පිළිබඳව වසර 23 කට වැඩි පළපුරුද්දක් සහිත අපගේ සභාපති නවීන් අදිකාරම මහතා, එම අංශයේ ඉහළ වෘත්තීය නිපුණතාවයක් පෙන්වා ඇත. ෆෝචූන් සඟරාව මඟින් පළකරනු ලබන සාර්ථක සමාගම් 500 ට අයත් සමාගම්වල සේවය කළ, පළපුරුදු විදුලි සංදේශ, තාක්ෂණ සහ කළමනාකරණ විධායකවරයෙකු වන නවීන් අදිකාරම මහතා, ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව, චීනය සහ නේපාලය ඇතුළු ලොව විවිධ රටවල බහු ජාතික, බහු සංස්කෘතික සහ බහු වාර්ගික සමාජයන් තුළ සේවය කර අත්දැකීම් ලබා සිටින ක්‍රමෝපායික නායකයෙක් ද, සාර්ථක දැක්මක් සහිත අති සාර්ථක ව්‍යවසායකයෙක් ද වේ.

බහු-මාන ටෙලිකොම් සැපයුම් සේවාවන්ට අදාල පෙරගෙවුම් සහ පසුගෙවුම් සේවාවන් මිශ්‍ර කිරීම සහ කළමනාකරණය කිරීම, බොහෝ CRM පද්ධති ක්‍රියාත්මක කිරීම, OCS (මාර්ගගත අයකිරීම් පද්ධති), ටෙලිකොම් බිල්කරණ පද්ධති, ඉදිරි පරපුරේ පරිගණක ජාල (NGN), SPD සහ VAS සේවාවලට අදාල වංචා කළමනාකරණ පද්ධති පිළිබඳව හසල දැනුමක් ඒ මහතා සතුව ඇත.

ඔහු පහත සඳහන් කමිටු/ සංවිධානවල ද සේවය කරයි.

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පාලක සභා සාමාජික
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා රෙස්ට් හවුසස් ලිමිටඩ්
- උපදේශක කාරක සභා සාමාජික - ව්‍යාපෘති කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා පාර්ශ්වය

අපගේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි

එම්.එස්.එම්. ෆවුසර් මහතා - ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (එක්සත් රාජධානිය), ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (එක්සත් රාජධානිය)

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි වන මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මෙහොමඩ් ෆවුසර් මහතා එක්සත් රාජධානියේ මිඩ්ල්සෙක්ස් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගෙන ඇති අතර, එක්සත් රාජධානියේ වුල්වර්හැම්ප්ටන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඔහු වෘත්තියෙන් අලෙවිකරුවෙකි.

ඔහු පහත සඳහන් වාණිජ ආයතනවල සේවය කරයි.

- අධ්‍යක්ෂ ජනරාල් - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - බී.සී.ඒ.එස්. විශ්ව විද්‍යාලය
- උපදේශක - අලෙවි සහ සන්නිවේදන, සී/ස පැරඩයිස් ෆාම් (පෞද්ගලික) සමාගම

අධ්‍යක්ෂ - ඒ.එච්.එම්. අලවි මහතා

වර්තමානයේදී සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරන ඒ.එච්.එම්. අලවි මහතා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරයි.

අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත

ටී.වී. වීරසේන මහතා - වාණිජවේදී (විශේෂ) උපාධිය, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

ටී.වී. වීරසේන මහතා ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වන අතර, 2013 වර්ෂයේදී සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සාමාජික වශයෙන් සේවය කරමින් සිටියි. තවද, ආරම්භයේ සිටම සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ විගණන කමිටුවේ සභාපතීත්වය දරනු ලැබේ.

වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

- ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ආඥාත සාමාජිකත්වය (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී රාජ්‍ය අංශය)
- ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - කාර්මික විද්‍යාලය
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
- වරලත් ගණකාධිකාරී අවසාන් පරීක්ෂණය සමත්
- වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
- ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව - කාර්මික විද්‍යාලය

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම වාර්ෂික වාර්තාව - 2017

අධ්‍යක්ෂ

ආචාර්ය නිහාල් සමරප්පුලි මහතා - විද්‍යාවේදී උපාධිය (කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය), විද්‍යාපති උපාධිය (කෘෂිකර්ම ව්‍යාප්ති), ආචාර්ය උපාධිය (ආර්ථික විද්‍යාව)

ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල සේවය කර වසර 35 කට වැඩි පළපුරුද්දක් සහිත ආචාර්ය නිහාල් සමරප්පුලි මහතා වෘත්තියෙන් ආර්ථික විද්‍යාඥයෙක්/ ප්‍රතිපත්ති විශ්ලේෂකයෙක් වේ. තවද, ඔහු ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජාතීන්ගේ ආයතනයක් වන කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) වැනි ජාත්‍යන්තර සංවිධානවල උපදේශකවරයෙකු වශයෙන් ද කටයුතු කර ඇත.

ඔහු පුළුල් විෂය පරාසයක 300 කට අධික වාර්තා, ප්‍රතිපත්ති පත්‍රිකා, පර්යේෂණ පත්‍රිකා පළකර/ ලියා ඇති අතර, සංවර්ධන සැලසුම්, ප්‍රතිපත්ති විශ්ලේෂණය, ආයෝජන සහ වෙළඳ ප්‍රවර්ධන, ජාත්‍යන්තර ගිවිසුම් සාකච්ඡා සම්මුති පිළිබඳ විශේෂ විශේෂඥ ඥාණය ලබාගෙන ඇත.

වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

- ටෝක්යෝ සිමෙන්ට් (ලංකා) සමාගම, කොළඹ 03, ශ්‍රී ලංකාව (අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ)
- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (අධ්‍යක්ෂ ජනරාල් - ආයෝජන)
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන)
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (අධ්‍යක්ෂ - පර්යේෂණ)
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත, ශ්‍රී ලංකාව (කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ)
- රබර් පර්යේෂණ මණ්ඩලය, නිවිතිගලකැලේ, මතුගම, ශ්‍රී ලංකාව (පුහුණු නිලධාරී)
- මහවැලි සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකාව (සහකාර පාංශු රසායනඥ)

අධ්‍යක්ෂ

විශ්‍රාමික ලුතිනන් කර්නල් ශූ.පී.පී. කවිකේෂව මහතා
වර්තමානයේදී සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් සේවය කරන ශූ.පී.පී. කවිකේෂව මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගෙන ඇති අතර, දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇත. ඔහු වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු වන අතර, ශ්‍රී ලංකා යුධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු විය. තවද, ඔහු ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර, ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගම් සංවිධානයේ (OPA) සාමාජිකයෙක් ද වේ.

වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

ඔහු පහත සඳහන් වාණිජ ආයතනවල සේවය කරයි.

- සාමාන්‍යාධිකාරි - සී/ස වෙතෝරා ඉන්ටර්නැෂනල් ප්‍රොජෙක්ට්ස් (පෞද්) සමාගම
- ව්‍යාපෘති විගණක - සී/ස මැක්සෙයාර් (පෞද්) සමාගම
- අධිකාරි ලත් නිලධාරි - ශ්‍රී ලංකා යුධ හමුදාව

අධ්‍යක්ෂ

අරුණ චතුරක කීර්තිරත්න මහතා

තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙක් වන අරුණ චතුරක කීර්තිරත්න මහතා සී/ස NHK හෝල්ඩින්ස් (පෞද්) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ වේ. ඔහු ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් පිරිනමන ලද 2012 වසරේ තරුණ ව්‍යවසායකයා (ජාතික සහ සබරගමුව පළාත් ජයග්‍රාහකයා) ලෙස පිදුම් ලැබීය.

වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

- කළමනාකාර අධ්‍යක්ෂ - NHK හෝල්ඩින්ස් (පෞද්) සමාගම
- අධ්‍යක්ෂ - සී/ස ලංකා සීනි (පුද්) සමාගම
- උපදේශක (භූමි දර්ශන සැකසීම) - NSBM හරිත විශ්ව විද්‍යාලය
- 2012, 2013 සහ 2014 කේයී (Caaye) තරුණ ව්‍යවසායක සමුළුව සඳහා නියෝජිතයෙකු ලෙස සහභාගි විය.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගවීම, විනිවිදභාවය, සාධාරණත්වය සහ වගකීම හා ආයතනික කටයුතු මෙහෙයවීමේ, පාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ක්‍රමය සහතික කරනු වස්, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් ආයතනික පාලන රාමුවක් ක්‍රියාත්මක කරනු ලැබේ. සුදුසු ආයතනික ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික පාලනයේ වඩාත් උචිත ක්‍රියාමාර්ගයන් මඟින් ප්‍රගතිය කරා මඟපෙන්වීම සහ මෙහෙයවීම සිදුකරනු ලැබේ. මෙම ආයතනික පාලන ක්‍රියාමාර්ගයන් මඟින් තීරණ ගැනීමේ තත්ත්වය වැඩිදියුණු කරන අතර, සමාගමේ වර්ධනය, ලාභදායීත්වය සහ තිරසාරභාවය සහතික කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

සභාපතිතුමා විසින් මෙහෙයවනු ලබන සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති සහ ප්‍රගතීන් ගතික පරිසරයක ප්‍රමාණවත් ලෙස ශක්තිමත් සහ අදාල වන බවට සහතික වීමට බැඳී සිටී. ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් පත්කරන ලද සභාපති සහ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී යන විධායක අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස්දෙනෙකුගෙන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම්වරයා වෙත සහ කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ඇත.

සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සියලුම සේවකයින් සමාගමේ කීර්තිනාමය කෙරෙහි බලපෑ හැකි යුතුකම් සහ වගකීම් ඉටුකිරීමේදී මෙම රාමුව අනුගමනය කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාරකාරත්ව බැඳීම් ඉටුකිරීමේදී සමාගමේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා ක්‍රියාකළ යුතුය. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම ආයතනික පාලන රාමුව අනුගමනය කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන අවශ්‍යතාවයන්, ස්වේච්ඡා කේත, ඉතා හොඳ වෙළෙඳපොල පරිවයන් සහ විනිවිදභාවයකින් යුතුව පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් ලබාදීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනු ලැබේ. නිරන්තරයෙන් බහු ශික්ෂණ නිපුණතාවන් පෙන්වමින් තෝරාගත් ක්ෂේත්‍රවල ඉහළම ස්ථානයට පැමිණ ඇති සහ විවිධ අංශවල විශේෂඥයින්ගෙන් සමන්විත ස්වාධීන කමිටුවක නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය විසින් පත්කරන ලද ඉතා ගෞරවනීය පුද්ගලයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම වෙනුවෙන්
ගළපාය මාර්ගික සැලැස්මක් සහ ප්‍රධාන ප්‍රතිපත්ති අනුමත කරනු ලබන අතර, ඒවා ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ ප්‍රධාන කළමනාකරණ සේවක මණ්ඩලය මඟින් ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ.

විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කටයුතු

ආයතනික ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීමෙහිලා සමාගමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී වෘත්තීය නිසි සැලකිල්ල, ආචාර ධර්ම, විනිවිදභාවය සහ ඒකීයභාවය පිළිබඳ වඩාත් යහපත් වත්පිළිවෙත් සහතික කරනු වස් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් නිරන්තරව අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනු ලැබේ. එබැවින්, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් ආයතනික යහපාලනයේ වටිනාකම හඳුනාගන්නා අතර, ශක්‍ය තිරසාර ව්‍යාපාරයක් සහතික කරමින් අවදානම් කළමනාකරණය කිරීමට සහ එහි පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් එකතු කිරීමට එමඟින් අවස්ථා සලසා දෙන බව විශ්වාස කෙරේ. තවද, විවිධ ක්ෂේත්‍රවල වෘත්තීය නිපුණතාවන් ඇති විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත ඉතා දක්ෂ විගණන කමිටුවක පැවැත්ම මඟින් ආයතනික පාලනයේ ඉතා හොඳ පරිවයන් සඳහා අපගේ කැපවීම වන බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාගමේ ආයතනික කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කරනු වස්, සාකච්ඡා කර උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපාය මාර්ග, ව්‍යාපාරික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ එවැනි උපාය මාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ වර්ධනය සහතික කිරීම වැනි අනෙකුත් වැදගත් කරුණුවලට අමතරව, කළමනාකරණ ගිණුම් සහ ප්‍රගති වාර්තා සමාලෝචනය කරනු ලැබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංයුක්ත සැලසුම්, වාර්ෂික අයවැය, ප්‍රාග්ධන වියදම්, නව ආයෝජන සහ ආයෝජන පිළිබඳ යෝජනා සමාලෝචනය කිරීමෙන් අනතුරුව, නව ව්‍යාපාර සඳහා අනුමැතිය ලබාදෙනු ලැබේ.

සමාගම් ලේකම්වරු සහ ස්වාධීන වෘත්තීය උපදෙස්

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විට සමාගම් ලේකම්වරුන්ගෙන් සහ විවිධ බාහිර වෘත්තීය ආයතනවලින් ස්වාධීන වෘත්තීය උපදෙස් ඉල්ලා සිටිනු ලැබේ. තවද, සමාගමේ සංයුක්ත ක්‍රමෝපායට අනුව, සමගාමී තාක්ෂණික අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා සමාගම විසින් කෘෂිකර්ම, තාක්ෂණික සහ මූල්‍ය විශේෂඥයින් සමඟ සමීපව කටයුතු කරනු ලැබේ.

ව්‍යාපාරික ඥාණය සහ කළමනාකරණ රැස්වීම්

ඒකකයේ ඵලදායී කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සමාගම උපාය මාර්ගික ව්‍යාපාර ඒකකයේ මට්ටමින් සතිපතා මෙහෙයුම් රැස්වීම් පවත්වයි. තවද, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් සමාගමේ කටයුතු සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අමතරව, මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලැබේ. මෙම කළමනාකරණ රැස්වීම් මාසයේ තුන්වන සතියේ සෑම බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනකම පිළිවෙලින් පැල්වත්ත සහ සෙවනගල ඒකකවලදී පවත්වනු ලබන අතර, සභාපති සහ/හෝ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි විසින් එහි මූලසුන හොබවනු ලැබේ. සියලුම ප්‍රාදේශීය ප්‍රධානීන් සහ අංශ ප්‍රධානීන් මෙම රැස්වීම්වලට සහභාගී වන අතර, එහිදී පසුගිය මාසයේ ඔවුන්ගේ කාර්යසාධනය ඉදිරිපත් කිරීමටත්, ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව සහ මාසය තුළ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා එම අභියෝග ජයගැනීමට උපාය මාර්ග සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරිණි.

මූල්‍ය වාර්තාකරණය

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජය සතු ව්‍යාපාර සඳහා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් ලෙස එහි වාර්ෂික වාර්තා කාලානුරූපව පළකිරීම සඳහා සළකා බලනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් අවශ්‍ය මෙහෙයුම් තොරතුරු මෙම වාර්ෂික වාර්තාවල අඩංගු කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

අවදානම් කළමනාකරණ සමාලෝචනය

අවදානම් වර්ගය	විස්තරය	ක්‍රියාකාරී සැලැස්ම
මෙහෙයුම් අවදානම	උක් වගාව සඳහා ඉඩම් ලබාගැනීම	උක් මිල රු. 4,500/- සිට රු. 5,000/- දක්වා වැඩිකිරීම ණය පදනම මත වගා අත්තිකාරම් සහ වෙනත් ද්‍රව්‍ය ලබාදීම රෝය හඳුන්වා දුන් පොහොර සහනාධාරය මඟින් උක් ගොවීන් ද ප්‍රතිලාභ ලැබීම
ණය අවදානම	ගොවීන්ට ලබා දී ඇති යෙදවුම්වලින් පැනනඟින බොල් ණය	ණය පියවාගැනීම සඳහා කාර්ය මණ්ඩලය වෙත වැඩි වගකීමක් ලබාදීම
උද්ධමන අවදානම	යෙදවුම් සහ පොදුකාර්ය පිරිවැය ඉහළයාම හේතුවෙන් ලාභදායීතාවය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම	ඵලදායීතාව ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරිවැය අඩුකිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
වෙළෙඳපොල අවදානම	දේශීය සීනි සැපයුම්කරුවන් විසින් අඩු මිලට සීනි ආනයනය කිරීම	ඒකක පොදුකාර්ය පිරිවැය අඩුකිරීම සඳහා නිෂ්පාදන පරිමාව වැඩිකිරීම
පාරිසරික අවදානම	අලින්ගෙන් සහ කාලගුණික විපර්යාස මඟින් උක් වගාවට සිදුවන හානි නිසා අස්වැන්න අඩුවීම	සමාගමේ වියදමින් අලි අගල්, වැටවල් සහ මිනිස් බාධක සකස් කිරීම



අපගේ සංස්කෘතිය සහ සාරධර්ම

අපගේ ගොවීන්

ගොවියා අපගේ රජුය. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ විශ්වාසය වනුයේ ගොවියා සමාගමේ ප්‍රධාන සහ ඉතා වැදගත් පාර්ශ්වකරුවකු වන බවයි. සියලුම ඉඩම් පාහේ ගොවීන් විසින් වගාකරනු ලබන බැවින්, ඔවුන්ගේ වගාව සඳහා සීමිත ඉඩම් ප්‍රමාණයක් පමණක් ඔවුන් සතුව පැවතීම සෙවනගල සම්බන්ධයෙන් තීරණාත්මක සාධකයක් වේ.

හෙක්ටයාරයක උක් වගාවකින් ලැබෙන සාමාන්‍ය ආදායම මසකට රුපියල් 35,000/- ක් පමණ වන බව ඇස්තමේන්තු කෙරේ. බොහෝ ප්‍රදේශවල උක් වගාවේ නිරත වූ ගොවීන්ගේ ආදායම පහළ මට්ටමක පැවතුනි. මෙම තත්ත්වය මඟින් ගොවීන් මෙම කර්මාන්තයේ නියැලීම අධෛර්යමත් කළ අතර, ඔවුහු වෙනත් වගාවන් කරා යොමුවෙමින් සිටියහ. ආරම්භයේදීම ලංකා සීනි සමාගම මෙම තත්ත්වය හඳුනාගත් අතර, ගොවීන්ට ඔවුන්ගේ ආදායම වැඩිකර ගැනීමට සහාය වීමට මූලික පියවර බොහොමයක් ගනු ලැබීය. වර්තමානයේදී ගොවියෙකුට උක් දඬු මෙට්‍රික් ටොන් එකකට රුපියල් 5,000/- ක් ගෙවනු ලබන අතර, එය මීට පෙර මෙට්‍රික් ටොන් එකකට රුපියල් 4,500/- ක් විය. ඒ අනුව, මේ වන විට, උක් වගා ඉතිහාසයේ උක් දඬු මෙට්‍රික් ටොන් එකකට වැඩිම ගෙවන්නා සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම වේ. ගොවියා දිරිමත් කිරීම සඳහා 2013 දී කළමනාකාරීත්වය විසින් සිය ලාභයෙන් 10% ක් ගොවි දිරිගැන්වීම් සඳහා වෙන්කිරීමට තීරණය කළේය.

අපගේ පාරිභෝගිකයා

අපගේ පාරිභෝගිකයා අපගේ අපේක්ෂාවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට වඩා අපගේ පාරිභෝගිකයින් වේ. ඔවුන්ට ගුණාත්මක සීනි සාධාරණ මිලකට ලබාදීම අපගේ මූලික අරමුණයි. ශ්‍රී ලාංකිකයෙකුගේ ඒක පුද්ගල සීනි පරිභෝජනය වසරකට කිලෝග්‍රෑම් 30 ත් 35 ත් අතර වේ. අපගේ නිෂ්පාදන ධාරිතාව 7% ක් වැනි පහළ අනුපාතයක පවතින බැවින්, ඉතිරි 93% ආනයනය කිරීමට සිදුවේ. සීනි ආනයනය සඳහා වාර්ෂිකව ඇ.ඩො. මිලියන 250 කට වඩා වැය වේ. මෙය අපගේ ජාතික ආදායමට ප්‍රධාන ඍණාත්මක බලපෑමකි.

අපගේ සේවකයා

අපගේ සේවකයා අපගේ ධනයයි. පක්ෂපාතී හා අභිප්‍රේරිත සේවකයින් නොමැතිව කිසිදු ආයතනයකට සාර්ථක විය නොහැක. මෙහෙයුම් ප්‍රතිඵල යනු අපගේ සේවකයින්ගේ කැපවීමේ සහ උත්සාහයේ මට්ටම පිළිබිඹු කිරීමකි. මානව සම්පත තෙරෙහි ලංකා සීනි සමාගමේ මූලික අවධානයක් යොමු කෙරේ. අතීතයේදී සීනි කර්මාන්තයේ සේවකයින් රැකියා කොන්දේසි, අඩු මාසික ආදායම් මට්ටම, ප්‍රසාද දීමනා ආශ්‍රිත ගැටළු සහ උසස්වීම් යනාදිය සම්බන්ධයෙන් ඔවුන්ගේ දිවිය තුළ බොහෝ අසීරුතාවන්ට මුහුණ දෙමින් සිටියහ. මෙම කරුණු දැනගැනීමෙන් අනතුරුව, ලංකා සීනි සමාගම ප්‍රමුඛතාවක් ලබාදී මෙම ගැටළු විසඳීම ආරම්භ කරන ලදී.

යහ පාලනය

අපගේ ව්‍යවස්ථාපිත විගණකවරුන් වනුයේ විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. බාහිර විගණකවරුන්ට අමතරව, පැල්වත්ත සහ සෙවනගල යන ඒකක දෙකෙහිම අභ්‍යන්තර විගණන අංශ ඇති අතර, ඒවා ප්‍රධාන විධායක නිලධාරි සහ සභාපති වෙත සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව මඟින් විධිමත් පදනමක් මත අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කිරීම, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් නිදහසට කරුණු විමසීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එම වාර්තා ඔවුන්ගේ අනාවරණය කරගැනීම් සමඟ ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබේ.

දුෂ්කරතා

අපට අනාගතය කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කිරීමට හැකි වන පරිදි, තවමත් විසඳිය යුතුව ඇති ප්‍රධාන ගැටළු කිහිපයක් ඇත.

පැල්වත්ත සහ සෙවනගල යන ස්ථාන දෙකෙහිම සමාගමට අයත් නොවන වංචල වත්කම් තවමත් පවතී. ඒවා ඉවත් කිරීමට හෝ ක්‍රියාවලියට අන්තර්ග්‍රහණය කිරීමට හැකිවනු පිණිස නෛතික ක්‍රියාවලිය අවසන් වන තුරු අපි බලා සිටින්නෙමු.

ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී ස්වභාවයක් ගන්නා අතර, ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගන්නා තෙක් අපගේ මධ්‍යකාලීන සහ දිගුකාලීන සැලසුම් නවතා දැමීමට අපට සිදුවී ඇත. මෙය කළමනාකරණයේ පාලනයෙන් බැහැරව සිදුවන්නකි. ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාගැනීම සඳහා කළමනාකරණය විසින් දැනටමත් උපාය මාර්ග සකස් කර ඇත. නව ආයෝජනය සඳහා අරමුදල් සැපයීම අප ගමන් මාර්ගයේ පවත්නා තවත් ගැටළුවකි. පැල්වත්ත සහ සෙවනගල ඉඩම්වල අයිතිය සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම සතුව නොපවතින අවස්ථාවේ බොහෝ බැංකු විසින් සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ඇප වශයෙන් බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, අපි භාණ්ඩාගාරයේ සහ අමාත්‍යාංශයේ සහාය ඇතිව අරමුදල් පිළියෙල කරගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින්නෙමු.

පැල්වත්ත තොරතුරු තාක්ෂණ පද්ධතියේ මෙහෙයුම් පිළිබඳ අතීත සහ වර්තමාන තොරතුරු ඇති අතර, සෙවනගල සේවකයින්ගේ සියලු වාර්තා පෙර කළමනාකාරීත්වය විසින් රැගෙන ගොස් ඇත. එබැවින්, පාරිතෝෂික ගෙවීම්, ප්‍රතිපාදන සහ සේවකයින් සම්බන්ධ වෙනත් කරුණු අත්හිටුවා ඇත. එමනිසා, සෙවනගල සීනි සමාගමේ පෙර කළමනාකාරීත්වයෙන් අදාල පොත් සහ වාර්තා ලබාගැනීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතුය.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම වාර්ෂික වාර්තාව - 2017

විගණන කමිටු වාර්තාව

සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයින් පත්කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකකයා වන විගණන කමිටු සභාපතිවරයාගේ මූලිකත්වය යටතේ අවශ්‍ය පරිදි විගණන කමිටු රැස්වීම් සැලසුම් කරන ලදී. සභාපති, අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනයකින් මෙම රැස්වීම් සඳහා සහභාගී වන අතර, සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ පරිපාලන විසින් මෙම රැස්වීම් සම්බන්ධීකරණය කරනු ලැබේ.

2017 ජනවාරි 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විගණන කමිටුව සඳහා පත්කරන ලද අතර, ඔවුන් 2017 වර්ෂය තුළදී සය වතාවක් රැස්වන ලදී. ඔවුන්ගේ සහභාගීත්වයන සඳහන් පරිදි වේ.

සංයුතිය

නම	පැමිණීම
ටී.වී. වීරසේන මහතා - සභාපති අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය (විධායක නොවන අධ්‍යක්ෂ - සී/ස ලංකා සීනි (පුද්) සමාගම)	06/06
ඩ්‍යූ.ජී.පී. කවිකේෂව මහතා සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ - සී/ස ලංකා සීනි (පුද්) සමාගම)	06/06
ඒ.සී. කීර්තිරත්න මහතා සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ - සී/ස ලංකා සීනි (පුද්) සමාගම)	06/06

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය සහ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම්වල ප්‍රමාණවත් බව ඇතුළු මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාල අධීක්ෂණ වගකීම් ඉටුකිරීම.

වරින් වර මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ ඇතුළු නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් සහ අනුකූල වන බව සහතික කිරීම සඳහා ක්‍රියාවලීන් සම්බන්ධයෙන් වගකීම් ඉටුකිරීම.

මූල්‍ය වර්ෂය තුළ ප්‍රගතිය

අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විගණන කමිටුවේ කටයුතු පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

විගණන කමිටුව විසින් විගණන විෂය පථය, අරමුණුගතභාවය සහ එහි සඵලදායීත්වය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. තවද, කමිටුව විසින් අනාගත අපේක්ෂාවන් සමඟ සී/ස ලංකා සීනි (පුද්) සමාගමේ මෙහෙයුම් සමාලෝචනය කිරීම ද සිදුකරනු ලබයි.

මතුකරන ලද ගැටළුවලට ප්‍රතිචාර වශයෙන් කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙන්ම, ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලනයන්හි සඵලදායීත්වය පිළිබඳව ව්‍යාපාරික ඒකකවල ප්‍රධානීන්/ අධිකාරිවරුන් සමඟ සාකච්ඡා කර ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී.

කළමනාකරණයේ පිළිතුරු සහිතව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳව කළමනාකරණය සහ විගණකවරුන් සමඟ සාකච්ඡා කරන ලදුව, විගණකවරුන් විසින් ඉස්මතු කරන ලද එකී වැරදි නිවැරදි කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනාගෙන ඇති ව්‍යාපාරික ඒකක දෙකෙහි (02) අභ්‍යන්තර පාලනයන්හි දුර්වලතා සහ වැරදි පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලද අතර, අදාල ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ සමඟ වැදගත් අංශ ඉස්මතු කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද සේවාවන්, සමාගමේ අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් සපුරාලීමට ඔවුන් විසින් දරන ලද ප්‍රයත්නය වෙතුවෙන් විගණන කමිටුව ස්තුතිය පළකරයි. කමිටුවේ සාමාජිකයින් විසින් දක්වන ලද දායකත්වය කෘතඥ පූර්වකව අගය කරනු ලැබේ. සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වය උදෙසා මූල්‍යමය කරුණු පිළිබඳ ඔවුන්ගේ නිපුණතාව සහ අදාළ අත්දැකීම් මිළ කළ නොහැකි විය.

ටී.වී. වීරසේන
සභාපති - විගණන කමිටුව


HV
0778

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - ප්‍රධාන කාර්යාලය



සභාපති
නවීත් අදිකාරම මහතා



අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
එම්.එස්.එම්. ෆවුසර් මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
ඩී.ල්.ඩී ජයන්ත මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
කේ ඩබ් වයි ජයතිලක



සාමාන්‍යාධිකාරී (මුදල්)
එන්.එච්.එස්. නවරත්න මහතා



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විකුණුම්/ අලෙවි)
එස්.ජේ. සේනානායක


සංවිධානයේ ව්‍යුහය - පැල්වත්ත
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
නියෝජ්‍ය කොමසාරිස්
- සමීපරම්
නියෝජ්‍ය කොමසාරිස්
- සරිමාන්ත ගලාවි
නියෝජ්‍ය කොමසාරිස්
- මිනව සම්පත
නියෝජ්‍ය කොමසාරිස්
- මූල්‍ය
නියෝජ්‍ය කොමසාරිස්
- මෙහෙයුම්
නියෝජ්‍ය කොමසාරිස්
- ඉන්ජිනේරු
කළමනාකරු
- සමීපරම්
කළමනාකරු
- ISFO
කළමනාකරු
- සෞඛ්‍ය විද්‍යාව
කළමනාකරු
- තොරතුරු තාක්ෂණය
කළමනාකරු
- මිලදී ගැනීම් අංශය
කළමනාකරු
- ප්‍රවේශ කාවර්ධන
කළමනාකරු
- සරිමාන්ත ගලාවි
කළමනාකරු
- ඉංජිනේරු
කළමනාකරු
- නිෂ්පාදන
කළමනාකරු
- පරීක්ෂණාගාරය
කළමනාකරු
- සත්ව පාලනය
කළමනාකරු
- මිනව සම්පත
කළමනාකරු
- පෞද්ගලික සම්පත්‌ධානය
කළමනාකරු
- පුහුණු සම්පත්‌ධානය
කළමනාකරු
- මූල්‍ය
කළමනාකරු
- FA/MA
කළමනාකරු
- ගබඩාව
කළමනාකරු
- ඉන්ධන පොළ
කළමනාකරු
- මිලදී ගැනීම් දෙපාර්තමේන්තුව
කළමනාකරු
- තෙරතුරු තාක්ෂණය
කළමනාකරු
- ආරක්ෂාව
කළමනාකරු
- ආරක්ෂාව
කළමනාකරු
- පිහිතුම් සටහන
කළමනාකරු
- සත්කාරක සේවය, තම්පහලා සංසිරණය
කළමනාකරු
- සෘණ වැඩ පොළ
කළමනාකරු
- ඉන්ජිනේරු
කළමනාකරු
- සරිමාන්ත ගලාවි

පැල්වත්ත කළමනාකරණ කණ්ඩායම



පළමු පෙළ (වමේ සිට දකුණට)
ආර්.එම්.ජේ. බණ්ඩාර- නිෂ්පාදන කළමනාකරු (ඉස්කාගාර), ලිලි එම්. හෙට්ටිආරච්චි- විධායක (ආයතනික තොරතුරු), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) , ඩී.එම්.එස්. බණ්ඩාර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂිකර්ම), ඩී.එල්.ඩී. ජයන්ත- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (වැ.බ.), ආර්.එම්.ඩබ්ලිව්. හේමකුමාර- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා), ආනන්ද දිසානායක - මූල්‍ය ගණකාධිකාරී, එච්.එම්.අයි.ඒ.කේ. කටුගහ නිෂ්පාදන කළමනාකරු (කර්මාන්තශාලා)

දෙවන පෙළ(වමේ සිට දකුණට)

ආර්.එම්.සී. පුෂ්පකුමාර - මිලදී ගැනීමේ කළමනාකරු, ජේ.ජී.ඩී.ජී. ප්‍රඥාසීල - කළමනාකරු (අස්වනු නෙලීම, මිලදී ගැනීම හා පැටවීම), ටී.එම්.ඩී. තෙන්නකෝන්- ආරක්ෂක කළමනාකරු (ආචරණ), ජේ.ඒ.ඒ.එන්. කුමාර කළමනාකරු (වතු ජනාවාස), සුපුන් කුමාර විදුලි - ඉංජිනේරු (කර්මාන්තශාලා), සමින්ද කුමාර කෝට්ටෙගෙ කළමනාකරණ ගණකාධිකාරී, ආර්.එම්.එන්. කරුණාරත්න - සහකාර කළමනාකරු (වතු ආරක්ෂණ), කේ.බී. විදුරසිංහ - බෝග විගණක සරින්ද පෙරේරා - විමර්ශන නිලධාරී

තුන්වන පෙළ(වමේ සිට දකුණට)

ආර්.ඒ.එම්. චන්දන - ශෂ්‍ය විද්‍යාඥ, එම්.බී චන්දන- ප්‍රධාන ඉංජිනේරු (කෘෂි වැඩමුළු), අනුර විජේසිංහ කළමනාකරු (ගබඩා) ඩබ්.එස්.කේ. රත්නායක- කළමනාකරු (ඉඩම් සංවර්ධන) කේ.එම්.කේ.කේ. බණ්ඩාර- කළමනාකරු (තොරතුරු තාක්ෂණ) එල්.ඒ.සී. ප්‍රසන්න - කළමනාකරු,කේන්ද්‍රීය වතු) එම්.එම්.ඒ. බණ්ඩාර - ඉංජිනේරු කළමනාකරු, ඒ. මාසාච්චි - ප්‍රධාන අභ්‍යන්තර විගණක


සංවිධානයේ ව්‍යුහය - සෙවනගල

සෙවනගල කළමනාකරණ කණ්ඩායම



පළමු පෙළ (වමේ සිට දකුණට)

එස්.ඒ. කමලසේන- වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්), ඩී.කේ.ඩබ්. ද සිල්වා - නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (කර්මාන්තශාලා), කේ.ඒ. වොල්ටර් - සාමාන්‍යාධිකාරි, කේ.වයි.ඊ. ජයතිලක- ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, එච්.එම්.එස්. සමරවීර - නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (කෘෂිකර්ම), කිත්සිරි පතිරණ - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

දෙවන පෙළ(වමේ සිට දකුණට)

ඩබ්.ඒ. ලයනල් වික්‍රමාරච්චි - කළමනාකරු (ප්‍රවාහන), එච්.එස්.බී. පිහිල්ලෙගෙදර - කළමනාකරු (ප්‍රසම්පාදන හා අලෙවි), එම්. උපුල් කුමාර - කළමනාකරු (කෘෂිකර්ම ව්‍යාප්ති) ,අතුල සිරිදේව - කළමනාකරු (කෘෂිකර්ම ව්‍යාප්ති), ඩී.සී. හෙට්ටිආරච්චි ප්‍රධාන ඉංජිනේරු - (බලශක්ති සහ වැඩමුළු), එස්.වී.ඩී.එස්. ප්‍රියන්ත - ප්‍රධාන ඉංජිනේරු, එන්.ඒ. විමලරත්න - වැඩබලන කළමනාකරු (උපකරණ) පී.ඒ.කේ. නන්දදේව - කළමනාකරු (කෘෂිකර්ම ව්‍යාප්ති) එස්.ඩබ්. කොඩිතුවක්කු - කළමනාකරු (කෘෂිකර්ම ව්‍යාප්ති)



ජාතික විගණන කාර්යාලය

මගේ අංකය } පීඑල්ඒ/ඩී/එල්එස්සී/01/17/06 ඔබේ අංකය } දිනය } 2019 ඔක්තෝබර් 18 දින

සභාපති,
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපති වාර්තාව

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ **2017** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත **2017**දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ

කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගම විසින් රු. 1, 425, 160, 007 ක් වටිනා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත සහ උපකරණ එම වත්කම්වල ඵලදායී ආර්ථික ආයු කාලය ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව අඛණ්ඩව භාවිතා කරනු ලබමින් සිටින අතර ඒ අනුව, අවශ්‍ය ගැලපීම් සිදු කිරීම.

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව, විලම්බිත බදු වත්කම්/ වගකීම් ගණනය කිරීමේදී, සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12හි 46 සහ 47 වන ඡේදයන්හි විස්තර කර ඇති පරිදි ගිණුම්කරණ කාල පරිච්ඡේදය අවසානයේදී පනවා ඇති බදු අනුපාතය යොදාගත යුතුය. එහෙත්, සමාගම විසින් අදාල සියයට 28ක බදු අනුපාතය යොදා ගැනීම වෙනුවට සියයට 12ක බදු අනුපාතයක් යොදාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා විලම්බිත බදු වියදම රු.295,600,375 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.1,184,931 ක් වන වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ 2014 වර්ෂයේ සිට අය කරගෙන නොතිබුණි. එහෙත්, ඒවා අය කරගැනීමට සමාගම විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(ඈ) පිළිවෙළින් රු.3,379,359 සහ රු.1,037,081ක් වන සමාගම විසින් සැපයුම්කරුවන්ට සහ සේවා සපයන්නන්ට ගෙවන ලද අත්තිකාරම් 2013 වර්ෂයේ සිට අය කරගෙන නොතිබුණි. එහෙත්, ඒවා අය කරගැනීමට සමාගම විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(ඉ) රු.13,658,977 ක් වන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට අදාලව ගෙවිය යුතු අධිභාරය 2011 වර්ෂයේ සිට නොගෙවා තිබුණි.

(ඊ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගොවීන්ට ලබාදෙන ලද රු.592,468,478 ක ණය 1987 වර්ෂයේ සිට අය කරගෙන නොතිබුණි. එහෙත්, එම ශේෂයන් අය කරගැනීමට සමාගම විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් ගොවීන්ට ලබාදෙන ලද රු.45,689,091 ක ණය වසර 02 සිට වසර 06 දක්වා අය කරගෙන නොතිබුණි. එහෙත්, එම ශේෂයන් අය කරගැනීමට සමාගම විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියෙන් නියම කර ඇති පරිදි පහත කරුණු සඳහන් කරමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගෙන ඇති බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට

අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2017 රු.	2016 රු.
ආදායම	4	7,616,939,721	7,728,890,324
විකුණුම් පිරිවැය		(6,102,695,984)	(5,547,832,698)
දළ ලාභය		1,514,243,737	2,181,057,626
වෙනත් ආදායම් සහ ලාභ	5	47,857,289	70,303,481
පරිපාලන වියදම්		(1,259,377,613)	(1,324,448,473)
මූල්‍ය පිරිවැය	6	(120,545,127)	(72,092,275)
මූල්‍ය ආදායම	6	220,524,878	151,467,371
බදුවලට පෙර ලාභය/ (අලාභය)	7	402,703,163	1,006,287,730
ආදායම් බදු වියදම්	8	(275,043,322)	(177,050,274)
වර්ෂය සඳහා ලාභය/ (අලාභය)		127,659,841	829,237,456
කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදුවලට පසු ශුද්ධ		29,830,638	43,835,935
කාලසීමාව තුළ මුළු විස්තීර්ණ ආදායම/ (වියදම), බදුවලට පසු ශුද්ධ		157,490,479	873,073,391
කොටසක ඉපැයුම්/ (අලාභය)	9	1,276,598	8,292,375

පිටු අංක 37 සිට 59 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කම්	සටහන්	2017 රු.	2016 රු.
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	10	2,203,255,444	2,425,649,078
විලම්බිත බදු වත්කම්	8	-	92,167,028
		2,203,255,444	**2,517,816,106**
ජංගම වත්කම්			
තොග	11	1,889,639,351	2,308,335,528
ජීව විද්‍යාත්මක වත්කම්	12	577,842,993	483,138,155
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	13	121,239,226	137,274,446
අත්තිකාරම් සහ පෙර ගෙවුම්		47,689,488	55,328,859
ගොවීන්ගෙන් අයවිය යුතු ණය	14	834,376,028	849,260,043
ආශ්‍රිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්	25.2	19,168,293	19,168,293
ආයෝජන	15	1,461,238,692	1,327,464,946
මුදල් හා මුදල් සමාන දෑ	21	250,426,762	29,520,476
		5,201,620,834	5,209,490,746
මුළු වත්කම්		**7,404,876,277**	**7,727,306,852**
හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	1,000	1,000
රජයේ ප්‍රදාන	17	4,047,990,194	4,047,943,334
සමුච්චිත ලාභ		997,226,537	750,427,480
මුළු හිමිකම්		**5,045,217,729**	**4,798,371,814**
ජංගම නොවන බැරකම්			
විලම්බිත බදු බැරකම	8	128,557,251	-
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	19	425,505,136	428,339,414
පොලියක් දරන ණය සහ ණය ගැනීම්	18	102,671,934	102,774,368
		656,734,321	531,113,782
ජංගම බැරකම්			
පොලියක් දරන ණය සහ ණය ගැනීම්	18	252,814,946	589,950,651
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	20	1,288,549,102	1,502,591,653
ගෙවිය යුතු ආදායම් බදු		161,560,180	305,278,952
ආශ්‍රිත පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල්		-	-
		1,702,924,227	2,397,821,256
මුළු හිමිකම් සහ බැරකම්		**7,404,876,277**	**7,727,306,852**

.....
සාමාන්‍යාධිකාරී - මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ :

....

පිටු අංක 37 සිට 59 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රජයේ ප්‍රදාන	සමුච්චිත ලාභ	මුළු ගණන
	රු.	රු.	රු.	රු.
2016 ජනවාරි මස පළමුවැනි දිනට	1,000	4,047,990,194	(122,644,911)	3,925,346,283
රජයේ ප්‍රදාන ආපසු ගෙවීම	-	-	-	-
පිරියත සහ යන්ත්‍රසූත්‍ර ප්‍රත්‍යාගණනය	-	-	-	-
ආරම්භක ශේෂ පත්‍රයේ ගැලපුම් සටහන්	-	(46,860)	(1000)	(47,860)
ගෙවූ ලාභාංශ	-	-	-	-
වර්ෂයේ ලාභය/ (අලාභය)	-	-	829,237,456	829,237,456
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	43,835,935	43,835,935
මුළු විස්තීර්ණ ආදායම	-	-	873,073,391	873,073,391
2016 දෙසැම්බර් 31 දිනට	1,000	4,047,943,334	750,427,480	4,798,371,814
ආදායම් බදු වෙනස්වීමේ ගැලපුම් සටහන්	-	-	89,783,484	89,783,484
පැල්වත්ත ශේෂ පත්‍රයේ/ ආදායම් බදු වෙනස්වීමේ ගැලපුම් සටහන්		-	(474,906)	(474,906)
ආරම්භක ශේෂ පත්‍රයේ ගැලපුම් සටහන්	-	46,860	-	46,860
වර්ෂයේ ලාභය	-		127,659,841	127,659,841
වෙනත් විස්තීර්ණ ආදායම්			29,830,638	29,830,638
මුළු විස්තීර්ණ ආදායම	-	-	157,490,479	157,490,479
2017 දෙසැම්බර් 31 දිනට	1,000	4,047,990,194	997,226,537	5,045,217,731

පිටු අංක 37 සිට 59 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

මෙහෙයුම් කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) මුදල් ප්‍රවාහය	සටහන්	2017	2016
		රු.	රු.
බදුවලට පෙර ලාභය/ (අලාභය)		402,703,163	1,006,287,730
ගැලපුම් :			
ක්ෂයවීම	10	352,440,192	321,801,429
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය/(අලාභය)		40,323	100,081
මූල්‍ය ආදායම	6	(220,524,878)	(151,467,371)
මූල්‍ය පිරිවැය	6	120,545,127	71,992,194
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන	19	71,127,492	69,730,649
ගොවි ණය සඳහා ප්‍රතිපාදන	11	-	-
බොල් ණය		-	-
බැරකම් ආපසු පොත්වලට ගැනීම		-	-
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		726,331,418	1,318,444,712
තොග වැඩිවීම/ (අඩුවීම)		418,696,177	(881,930,605)
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම		23,674,591	(52,616,071)
ගොවීන්ගෙන් ලැබිය යුතු ණය අඩුවීම		14,884,015	(11,373,798)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ (අඩුවීම)		(214,042,552)	413,140,230
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල්		969,543,648	785,664,469
ගෙවූ ආදායම් බදු		(108,207,480)	(385,035,428)
ගෙවූ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	19	(44,131,131)	(27,123,616)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		817,205,038	373,505,425
ආයෝජන කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) මුදල් ප්‍රවාහය			
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම		(130,086,876)	(147,791,872)
ස්ථාවර තැන්පතුවල ආයෝජන ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		(133,773,746)	(416,626,646)
ජීව විද්‍යාත්මක වත්කම්වල ආයෝජනය		(94,704,838)	141,060,217
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්		-	-
ලද මූල්‍ය ආදායම	6	220,524,878	151,467,371
ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(138,040,583)**	**(271,890,930)**
මූල්‍ය කටයුතුවලින් ලද/ (ඒ සඳහා යොදවන ලද) මුදල් ප්‍රවාහය			
ලබාගත් ණය/ මූල්‍ය කල්බදු		65,950,000	59,137,600
ණය පියවීම්	18	(21,174,192)	(14,979,472)
පෙර අයිතිකරු වෙනුවෙන් කරන ලද ගෙවීම්		-	-
රජයේ ප්‍රදාන ආපසු ගෙවීම	17	-	-
මූල්‍ය කල්බදු වගකීම යටතේ ප්‍රධාන ගෙවීම්	18	(41,954,449)	(40,450,309)
ගෙවූ පොළිය	6	(120,545,127)	(71,992,194)
ගෙවූ ලාභාංශ		-	-
මූල්‍ය කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(117,723,767)**	**(68,284,375)**
ප්‍රධාන කාර්යාලයේ සංචිත සඳහා ගැලපුම්		(474,906)	(47,860)
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		560,965,782	33,282,260
වර්ෂය ආරම්භයේදී පැවති මුදල් සහ මුදල් සමාන දෑ	21	(500,008,067)	(533,290,327)
වර්ෂය අවසානයේදී පැවති මුදල් සහ මුදල් සමාන දෑ	21	60,957,716	(500,008,067)

පිටු අංක 37 සිට 59 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව - 2017

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 පොදු කරුණු

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ලියාපදිංචිකර සංස්ථාගතකර ඇති ආයතනයකි. රජයට පවරාගැනීමෙන් පසුව, මෙම සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ස්ථාපිත කරන ලදී. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ, අංක 27, මෙල්බෙර්න් ඇවනිව්, කොළඹ 04 යන ස්ථානයේ වන අතර, එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන පිහිටා ඇත්තේ, ඇඹිලිපිටිය සහ බුත්තල යන ප්‍රදේශවලය.

සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාගත කිරීමෙන් පසුව, 2012 ඔක්තෝබර් 01 වැනි දින පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සහ සෙවනගල සීනි කර්මාන්තායතනයේ වත්කම් සහ වගකීම් සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී, ආයතනයේ ප්‍රධාන කාර්යයන් වූයේ උක් වගාකිරීම, සීනි සහ එතනෝල් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමයි.

1.3 නිකුත් කිරීම සඳහා අවසරලත් දිනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2019 ජුනි 21 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව අවසර ලබාදෙන ලදී.

2. පොදු ප්‍රතිපත්ති

2.1 සකස්කිරීමේ පදනම

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය යනාදියෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ.

අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙල කොට ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කොට ඇත්තේ ශ්‍රී ලංකා (රු.) වලිනි.

2.1.1 අනුකූලත්වය පිළිබඳ ප්‍රකාශය

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව

සිදුකර ඇත.

2.1.2. අඛණ්ඩ පැවැත්ම

අපේක්ෂිත අනාගත කාලපරිච්ඡේදයක් තුළ ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සහ වෙළඳාම කටයුතු ඇවර කිරීමට හෝ නතර කිරීමට ඔවුන්ට කිසිදු අදහසක් නොමැති බවටත් අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරුවක් කර ඇත.

2.2 විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

සමාගම විසින් එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.2.1 කාර්යමය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සමාගම විසින් මූලික වශයෙන් වාණිජමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකරන බැවින්, මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. එමඟින් මෙහි සඳහන් ව්‍යාපාරයට අදාල සිදුවීම් හා අවස්ථාවන්වල ආර්ථික තත්ත්වය වඩාත් හොඳින් පිළිබිඹු කෙරේ.

විදේශීය මුදලින් වූ ගණුදෙනු එකී ගණුදෙනුව සිදු වූ දින පැවති විදේශ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. වාර්තාකරණ දිනයේදී විදේශ ව්‍යවහාර මුදලින් නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් එදිනට පැවති විනිමය අනුපාතයන් යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. පරිවර්තනය හේතුවෙන් උද්ගත වන විදේශ විනිමය වෙනස ලාභාලාභ ප්‍රකාශය තුළදී හඳුනාගනු ලැබේ.

සියලුම වෙනස්කම් ලාභාලාභ ප්‍රකාශයට ගනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලකින් ඓතිහාසික පිරිවැය අනුව පවත්වාගෙන යනු ලබන මූල්‍යමය නොවන වත්කම් සහ වගකීම්, එකී ගණුදෙනුව සිදු වූ දිනයේදී පැවති විනිමය අනුපාතය අනුව පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මිනුම් කර ඇති මූල්‍යමය නොවන අයිතමයන්, සාධාරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාතයන් යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ. මූල්‍යමය නොවන අයිතමයන් නැවත පරිවර්තනය කිරීම හේතුකොටගෙන ඇතිවන ලාභ හෝ අලාභ, එම අයිතමයේ සාධාරණ වටිනාකම වෙනස්වීමේදී ඇති වූ ලාභ හෝ අලාභ හඳුනාගැනීමට අනුව සලකනු ලැබේ. (එනම්, වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී සාධාරණ වටිනාකම්, ලාභ හෝ අලාභ හඳුනාගනු ලබන අයිතමයන්ගේ පරිවර්තන වෙනස්කම්ද පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.)

2.2.2 ආදායම හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන්නේ කවදාද යන්න සැලකිල්ලට නොගෙන, ආර්ථික ප්‍රතිලාභය සමාගම වෙත ගලාඑනු ඇතැයි හැඟී යන සහ ආදායම නිශ්චිතව මැනිය හැකි වන ප්‍රමාණය දක්වා ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වාචිත ගෙවීම් කොන්දේසි සහ බදු හෝ තීරුබදු ඉවත් කිරීම සැලකිල්ලට ගෙන, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සමාගම විසින් ප්‍රධානියා හෝ නියෝජිතයා ලෙස ක්‍රියාකරන්නේ නම්, එහි ආදායම සකස්කර ගැනීම් නිශ්චය කරගැනීමට නිශ්චිත නිර්ණායකයන්ට අනුව තක්සේරු කරයි. සමාගම එහි සියලුම ආදායම් සකස් කරගැනීම් සම්බන්ධයෙන් ප්‍රධානියා ලෙස කටයුතු කරන බවට තීරණය කර ඇත. ආදායම හඳුනාගැනීමට පෙර පහත විස්තර කරන නිශ්චිත හඳුනාගැනීම් නිර්ණායකයන්ද සපුරාලිය යුතුය.

භාණ්ඩ විකිණීම

භාණ්ඩවල අයිතියේ සැලකිය යුතු අවදානම් හා වාසි ගැනුම්කරුට පවරා ඇති අවස්ථාවේදී භාණ්ඩ විකුණුම් ආදායම හඳුනාගනු ලැබේ. එකී ආස්ථිතාය සාමාන්‍යයෙන් අයිතිය හා බැඳුනු අඛණ්ඩ කළමනාකාරිත්ව සහභාගීත්වය රඳවාගැනීම හෝ විකිණූ භාණ්ඩවලට ඵලදායී පාලනයක් හෝ තබාගනු නොලැබේ.

පොළී ආදායම

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. පොළියක් දරන මූල්‍ය වත්කම් විකිණීමට ඇති තොග ලෙස වර්ගීකරණය කෙරේ. පොළී ආදායම හෝ වියදම, සඵල පොළී අනුපාතය යොදාගනිමින් සටහන් කෙරේ. මෙම අනුපාතය සත්‍ය වශයෙන්ම ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හා ලැබීම් මූල්‍ය උපකරණවල අපේක්ෂිත ආයුකාලය හෝ කෙටි කාලයක් තුළින් සුදුසු පරිදි මූල්‍ය වත්කම් හෝ වගකීම් ශුද්ධ කාරක අගය දක්වා වට්ටම් කෙරේ. පොළී ආදායම, ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් කෙරේ.

වත්කම් අපහරණයේ ලාභ සහ අලාභ

වත්කම් අපහරණ ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම්, ආදායම් අදාළ වත්කම්වල ධාරණ අගයන් සමඟ සැසඳීමෙනි. එය ලාභාලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුළ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කළ වත්කම් විකිණූ අවස්ථාවේදී ප්‍රත්‍යාගණනය අතිරික්ත සංචිතයේ අතුළත් මුදල් ප්‍රමාණයන් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.2.3 බදුකරණය

ප්‍රවර්තන බදු

ආදායම් බදු වියදමට ප්‍රවර්තන ආදායම් බදු ඇතුළත් වන අතර, එය හිමිකම් තුළ සෘජුව හඳුනාගන්නා ලද අයිතමයන්ට අදාල වන ප්‍රමාණය දක්වා හැර ආදායම් බදු වියදම ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

වාර්තාකරණ දිනට පනවන ලද බදු අනුපාතයන් සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා කරනු ලබන කවර හෝ ගැලපුමක් යොදාගනිමින් කාලපරිච්ඡේදය සඳහා බදු අයකළ හැකි ආදායම මත ගෙවිය යුතු යැයි අපේක්ෂිත බද්ද ප්‍රවර්තන බද්ද වේ.

විකුණුම් බදු

පහත සඳහන් දෑ හැර, ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බදුවලින් පසු ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ.

- වත්කම් හෝ සේවා මිලදී ගැනීමක් මත දැරූ විකුණුම් බදු, බදු බලධාරියාගෙන් අයකරගත නොහැකි වුවහොත් එවැනි අවස්ථාවලදී විකුණුම් බදු, අදාළ පරිදි වත්කම් පවරාගැනීමේ පිරිවැයෙන් කොටසක් ලෙස හෝ වියදම් අයිතමයේ කොටසක් ලෙස හඳුනාගනු ලැබේ.
- විකුණුම් බදු ප්‍රමාණය සහිතව ප්‍රකාශිත ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ ඇතුළත්ය.

බදු බලධාරියාගෙන් අයවිය යුතු හෝ බදු බලධාරියාට ගෙවිය යුතු ශුද්ධ විකුණුම් බදු ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ලැබිය යුතු දෑ හෝ ගෙවිය යුතු දෑ වල කොටසක් ලෙස ඇතුළත් කෙරේ.

විලම්බිත බදු

ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය යොදාගනිමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වත්කම් හා වගකීම්වල සාධාරණ අගය හා බදු කාර්යය සඳහා යොදාගත් වටිනාකමෙහි තාවකාලික වෙනස බදු සඳහා වෙන්කරනු ලැබේ.

2.2.4 වියදම්

කාලපරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දැරූ සියලුම වියදම් ආදායමෙන් අය කරගෙන ඇත.

අළුත්වැඩියාවන් හා අළුත්කිරීම්, එකී වියදම දරනු ලබන කාලපරිච්ඡේදයේ ලාභයෙන් අය කරගනු ලැබේ.

2.2.4.1 ණයට ගැනීමේ පිරිවැය

සුදුසුකම් ලබන වත්කමක පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලබන අවස්ථාවේදී එකී වත්කම පවරා ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිෂ්පාදනයක් සඳහා ඒවා සෘජුවම හේතුවිය හැකි ප්‍රමාණයට හැර, ණයට ගැනීමේ පිරිවැය හඳුනාගෙන ඇත්තේ, ඒවා දරන ලද කාල පරිච්ඡේදය තුළ වියදමක් වශයෙනි.

2.2.4.2 මූල්‍ය පිරිවැය

ලාභාලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලබන ණයට ගැනීම්වල පොළී වියදම මූල්‍ය පිරිවැයෙහි අන්තර්ගත වේ. සුදුසුකම් ලබන වත්කමක් පවරා ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිෂ්පාදනයක් සඳහා ඒවා සෘජුවම හේතුවිය නොහැකි ණයට ගැනීම් පිරිවැය, සඵල පොළී ක්‍රමය යොදාගෙන ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

විදේශීය ව්‍යවහාර මුදල් ලාභ සහ අලාභ ශුද්ධ පදනමක් මත වාර්තා කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.2.5 දේපල, පිරියත හා උපකරණ

සමාගමට අයත් වත්කම්

දේපල, පිරියත සහ උපකරණ අයිතම මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ ඇතොත් හානිකරණ පාඩු අඩුකිරීමෙනි.

දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට, එම වත්කම් අත්පත් කරගැනීමට සෘජුව ආරෝපිත වියදම් ඇතුළත් වේ. ස්වයං ඉදිකිරීම් වත්කම් පිරිවැයට ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, එකී වත්කම අපේක්ෂිත භාවිත කිරීමේ තත්ත්වයට පත්කරන තුරු සෘජුවම ආරෝපනය කළ පිරිවැය යම් වත්කමක් තිබූ තැනින් කඩා ඉවත් කිරීමට හා ඒවා යථා තත්ත්වයට පත්කිරීමට දැරූ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම්වල ණයට ගැනීම් පිරිවැය ඇතුළත් වේ. අදාළ උපකරණයක ක්‍රියාකාරිත්වයට සම්බන්ධව මිලදීගත් මෘදුකාංග පිරිවැය, උපකරණයේ පිරිවැය කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණයක කොටසක එකිනෙක වෙනස් ඵලදායී ආයුකාලයක් ඇතොත්, ඒවා දේපල, පිරියත හා උපකරණ ලෙස (ප්‍රධාන සංරචකයන්) වෙන වෙනම ගිණුම්ගත කරනු ලැබේ.

කල්බදු වත්කම්

වැඩපිළිවෙලක් තීරණය කර තිබුණද, එහි අඩංගු වුවද, කල්බද්දක් ආරම්භක දිනයේදීම වැඩපිළිවෙලෙහි යථා තත්ත්වය මත පදනම් වේ. වැඩපිළිවෙල ඉටුකර ගැනීම නිශ්චිත වත්කම හෝ වත්කම්වල භාවිතය මත රඳා පවතී නම්, හෝ වැඩපිළිවෙලක අයිතිය නිශ්චිතව විස්තර කර නැතත් වැඩපිළිවෙලෙහි වත්කම භාවිත කිරීමේ අයිතිය ඇති බව ප්‍රකාශ වේ.

කල්බදු වත්කමේ අයිතියට ආනුෂංගිකව විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට පැවරෙන මූල්‍ය කල්බදු වල්දී, කල්බදු දේපලෙහි, කල්බද්ද ආරම්භ වන දිනට සාධාරණ අගය හෝ එය අඩුනම් අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය ප්‍රාග්ධනගත කරනු ලැබේ. කල්බදු ගෙවීම්, මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීමේ අඩුවීම අතර විභාජනය කෙරේ. ඊට හේතුව වගකීමෙහි ඉතිරි ශේෂය මත පොලී අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යාම සාක්ෂාත් කරගැනීමයි. ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ගාස්තු මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනු ලැබේ.

කල්බදු වත්කමක් එහි ඵලදායී ආයුකාලය තුළ ක්ෂය කරනු ලැබේ. කෙසේ වෙතත්, කල්බදු කාලය අවසානයේදී සමාගමට අයිතිය ලබාගැනීමට සාධාරණ නිශ්චිතතාවයක් නැතිනම්, වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය හෝ කල්බදු කාලසීමාව යන දෙකින් අඩු කාලය තුළදී ක්ෂය කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව තුළ සරල මාර්ග පදනමක් මත ලාභාලාභ ප්‍රකාශයේ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

පසු වියදම්

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය, එකී අයිතමයේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒවි යැයි විශ්වාස කරන විට සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මිනිය හැකි නම් එම අයිතමයේ ධාරණ අගය තුළ හඳුනාගනු ලැබේ. ආදේශක කොටසේ ධාරණ අගය, පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තිය අනුව හඳුනා නොගනී.

දේපල, පිරියත හා උපකරණවල ඒදිනෙදා සේවා පිරිවැය දැරූ පරිදි ලාභාලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

හඳුනැගැනීම ඉවත් කිරීම

දේපල, පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය අපහරණය කිරීම මත හෝ එය භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. හඳුනාගැනීම ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ, ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස වර්ගීකරණය නොකෙරේ.

ක්ෂය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක් ක්ෂය කිරීම, එහි ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය තුළ සරල මාර්ග ක්‍රමයට ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ. එබැවින්, වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව ඉතා ආසන්න වශයෙන් පිළිබිඹු වේ.

කල්බදු කාලසීමාව අවසාන වන විට අයිතිය සමාගමට හිමිවන බවට සාධාරණව නිශ්චිතතාවයක් නොමැත්තේ නම්, මූල්‍ය කල්බදු යටතේ තබාගෙන ඇති වත්කම්, කල්බදු කාලසීමාව සහ ඒ හා සමාන අයිතිය ඇති වත්කම්වල ඵලදායී ආයුකාලය යන දෙකින් අඩු කාලසීමාව තුළ ක්ෂය කරනු ලැබේ. සින්නක්කර ඉඩම ක්ෂය කරනු නොලැබේ.

වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගත් දා සිට ආරම්භ වන අතර, එකී වත්කම විකිණීමට තබා ඇතිවිට හෝ හඳුනා නොගන්නා සේ වර්ග කළ විට ක්ෂය කිරීම නතර කෙරේ.

වත්කමක අවශේෂ වටිනාකම, ඵලදායී ආයුකාලය, ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කර, අදාල වන්නේ නම්, අපේක්ෂිත පරිදි ගැලපුම් කරනු ලැබේ.

2.2.6 තොග

යල් පිනූ සහ මන්දගාමී අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයට තොග අගය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම ගණනය කරනු ලබන්නේ, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී එය විකිණිය හැකි මිලෙන්, එය සම්පූර්ණ කිරීම සඳහා දරනු ලබන ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සඳහා දරනු ලැබිය හැකි ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙනි.

තොග එහි වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, පහත සඳහන් පිරිවැය සූත්‍රය භාවිත කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

නිෂ්පාදන තොග	- වාර්තාකරණ දිනය දක්වා ඒ මත දරන ලද පොදුකාර්ය පිරිවැය ඇතුළු සෘජු පිරිවැයට
උක් දඬු	- වාර්තාකරණ දිනය දක්වා දරන ලද තවාන් පිරිවැය සහ ඒ මත දරන ලද පොදුකාර්ය පිරිවැයෙන් කොටසක් ඇතුළු සෘජු පිරිවැයට
අතෙකුත් තොග	- තථ්‍ය පිරිවැයට
මාර්ගස්ථ තොග	- තථ්‍ය පිරිවැයට

2.2.7 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනාගැනීම සහ පසුව මැනීම

මූල්‍ය වත්කම්

මූලික හඳුනාගැනීම සහ මැනීම

පහත සඳහන් මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි විෂය පථය යටතේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස ලාභ හෝ අලාභ මඟින් වර්ගීකරණය කෙරේ. ණය සහ ලැබිය යුතු මුදල්, තබාගත් පරිණත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ සඵල ඉදිරිරැකුමක ව්‍යුත්පන්නයන් ලෙස හඳුන්වා දී ඇති ඉදිරිරැකුම් සාධන පත්‍ර අදාල පරිදි, මූලික හඳුනාගැනීමේදී සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට සටහන් කරන ලද මූල්‍ය වත්කම් හැර මූලික වශයෙන් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ අගයට ගණුදෙනු පිරිවැය එකතු කළ වටිනාකමට හඳුනාගනු ලැබේ. අලෙවි ස්ථානයේ රෙගුලාසි හෝ සම්මුති මඟින් ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම් බෙදාහැරීමේ අවශ්‍යතාව ඇතිවිට මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකුණුම්, විකුණුම් දිනයේදී හඳුනාගනු ලැබේ. උදා : සමාගම වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳුනු දිනය

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්, ණය හා අතෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පසුව මැනීම

මූල්‍ය වත්කම් පසුව මැනීම පහත විස්තර කර ඇති පරිදි ඒවායෙහි වර්ගීකරණය මත රඳා පවතී.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ කිසිදු වෙළඳපොලක ලැයිස්තුගත නොකරන, ස්ථාවර හෝ තීරණය කරනු ලබන ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මැනීමෙන් පසු සඵල පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිත කරමින් හානිකරණය අඩුකොට ක්‍රමක්ෂය පිරිවැයට එවැනි මූල්‍ය වත්කම් පසුව මැනීම සිදුකරනු ලැබේ. ක්‍රමක්ෂය ගණනය කරනු ලබන්නේ, පවරා ගැනීමේදී ගෙවූ වට්ටම් හෝ වාරික සැළකිල්ලට ගනිමින් සහ සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය ගණන් ගැනීමෙනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායමෙහි ඇතුළත් කෙරේ.

හඳුනාගැනීම අත්හැරීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීම අත්හැරීම කළ යුත්තේ,

- වත්කම්වලින් වන මුදල් ප්‍රවාහයන් ලබාගැනීම සඳහා වූ අයිතිය කල් ඉකුත් වූ විට.
- සමාගම, වත්කම්වලින් වන මුදල් ප්‍රවාහයන් ලබාගැනීම සඳහා වූ එහි අයිතිය පවරා ඇතිවිට හෝ 'වැඩපිළිවෙල තුළින් යන' ('Pass-through arrangement') යටතේ ලද මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන්ම වැඩි ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශ්වයකට ගෙවීමට වගකීමක් ඇතැයි උපකල්පනය කර ඇති විට. නැතහොත්,

  (අ) සමාගම, වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස පවරා ඇති විට, හෝ

  (ආ) සමාගම, වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස පවරාගෙන හෝ රඳවා තබාගෙන නොමැති විට, එහෙත්, වත්කමේ පාලනය පවරා ඇතිවිට.

සමාගම, වත්කමකින් වන මුදල් ප්‍රවාහයන් ලබාගැනීම සඳහා වූ අයිතිය පවරා ඇති විට හෝ වැඩපිළිවෙල තුළින් යාමට එකඟ වී ඇතිවිට, අයිතියේ අවදානම හා ප්‍රතිලාභ කොපමණ ප්‍රමාණයකට රඳවාගත්තාවාද යන්න ගැන ඇගයීමක් කරයි. එය පැවරීමක් හෝ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ රඳවා ගැනීමක් නොකරන විට, වත්කමේ පාලනය පැවරීමක්ද නොකරයි. එහිදී, සමාගමේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනා ගනී. එවැනි අවස්ථාවක සමාගම වත්කමේ වගකීමද හඳුනා ගනී. පැවරූ වත්කම හා ආශ්‍රිත වගකීම, සමාගම තබාගත්තා අයිතිය හා වගකීම නිරූපනය වන පදනමක් යටතේ මනිනු ලැබේ.

පැවරූ වත්කමේ අඛණ්ඩ මැදිහත්වීම ඇපයක ස්වභාවයක් ගත්විට, වත්කමේ මුල් ධාරණ වටිනාකම සහ සමාගම ආපසු ගෙවීමට අවශ්‍ය වූ ප්‍රතිඅත්ථාවේ උපරිම අගය යන දෙකින් අඩු වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් හානිකරණය

සමාගම, එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක් හානිකරණය වේද යන්න ගැන යම් අරමුණුගත සාක්ෂි තිබේදැයි බලයි. මූල්‍ය වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක් හානිකරණය කළයුතු යැයි අදහස් කළහොත් වත්කමේ මූලික හඳුනා ගැනීමෙන් පසු සිදු වූ සිදුවීමක් හෝ සිදුවීම් හේතුකොට ගෙන හානිකරණ පිළිබඳ අරමුණු සහගත සාක්ෂි ඇතොත් (දැරූ අලාභ සහගත සිද්ධියක්) සහ එකී හානි සිදුවීම හෝ සිදුවීම්වලින් මූල්‍ය වත්කමක හෝ කාණ්ඩයක අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් වෙතොත් එය විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැක. හානිකරණ සාක්ෂිවලට අතුළත් වන්නේ ණයගැතියෙකු හෝ ණයගැතියන් බරපතල ලෙස මූල්‍ය දුෂ්කරතාවලට පත්වීම, පොලී හෝ මූලික ප්‍රාග්ධනය නොගෙවා සිටීම හෝ යුතුකම් පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්විය හැකි සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් කිරීම සහ නිරීක්ෂණය කළ හැකි දත්තවලින් අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල මිනිය හැකි අඩුවීමක් පිළිබිඹු වීම, එනම්, හිඟ මුදල්වල හෝ ගෙවීම් පැහැර හැරීම හා සම්බන්ධ ආර්ථික තත්ත්වයන්වල වෙනස්වීම් ය.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් සඳහා සමාගම මුලින්ම එක් එක් මූල්‍ය වත්කමට වැදගත් වන හෝ මූල්‍ය වත්කම්වලට සාමූහිකව වැදගත් නමුත්, එක් එක් වත්කමට වැදගත් නොවන හානිකරණ අරමුණු සාක්ෂි තිබේදැයි තක්සේරු කරයි. සමාගම හානිකරණ අරමුණු සාක්ෂි තනි තනිව තක්සේරු කළ මූල්‍ය වත්කමට තැනි බවට තීරණය කළහොත්, වැදගත් වුවත් නැතත් එය සමාන ණය අවදානම් ඇති මූල්‍ය වත්කම් කාණ්ඩයේ වත්කමක් ලෙස ඇතුළත් කර, ඒවා සාමූහිකව හානිකරණය සඳහා තක්සේරු කෙරේ. හානිකරණය සඳහා වෙන් වෙන්ව තක්සේරු කරන වත්කම් සහ හඳුනාගත් හානිකරණ පාඩුවක් හෝ අඛණ්ඩව සිදුවන පාඩුවක් සාමූහික හානිකරණ තක්සේරුවක ඇතුළත් කරනු ලැබේ.

හානිකරණ පාඩුවක් සිදු වූ බවට අරමුණු සාක්ෂි ඇතොත්, පාඩුවේ වටිනාකම වත්කමේ ධාරණ වටිනාකම සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල වර්තමාන අගය යන දෙකෙහි වෙනස ලෙස මනිනු ලැබේ. (මේ දක්වා සිදු නොවුණු අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදලකට විචල්‍ය පොලී අනුපාතයක් ඇතොත්, යම් හානිකරණ පාඩුවක් මැනීම සඳහා භාවිත කරන වට්ටම් අනුපාතය වන්නේ වර්තමාන සඵල පොලී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය, දීමනා ගිණුමක් (Allowance Account) භාවිත කිරීමෙන් අඩුකරනු ලබන අතර, හානි වටිනාකම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

ආශ්‍රිත දීමනා සමඟ ලැබිය යුතු දෑ අනාගතයේදී සත්‍ය වශයෙන්ම අයකර ගැනීමක් බලාපොරොත්තු විය නොහැකි නිසා කපාහරිනු ලැබේ. සියලුම සමාන දෑ (collateral) උපලබ්ධි වී හෝ සමාගමට මාරු කර ඇත. හානිකරණය හඳුනැගැනීමෙන් පසු යම් සිදුවීමක් හේතුකොට ගෙන, පසු වර්ෂයක්දී ඇස්තමේන්තුගත හානිකරණ පාඩුව අඩු හෝ වැඩි වුවහොත් මුලින් හඳුනාගත් හානිකරණ පාඩුව, දීමනා ගිණුමෙන් ගැලපීම මඟින් අඩු හෝ වැඩි කරනු ලැබේ. අනාගත කපාහැරීමක් පසුව අයකර ගතහොත්, එම අයකර ගැනීම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි පිළිබිඹු කරනු ලබයි.

මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම සහ මැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. ඒවාට ණය සහ ණය ගැනීම් හෝ අදාල පරිදි සඵල ඉදිරිරැකුම් උපකරණ ලෙස නම්කර ඇති ව්‍යුත්පන්නයන් ලෙස හඳුනාගෙන ඇති වගකීම් ඇතුළත් වේ. සමාගම විසින් මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ. ණය සහ ණය ගැනීම් මූල්‍ය පිරිවැයට සෘජුවම ආරෝපනය කළ හැකි අවස්ථාවේදී, එය ඇතුළුව සාධාරණ අගයට සියලු මූල්‍ය වගකීම් මූලිකව හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ ණය සහ ණයට ගැනීම් ඇතුළත් වේ.

පසුව මැනීම

මූල්‍ය වගකීම් මැනීම පහත විස්තර කර ඇති පරිදි ඒවායෙහි වර්ගීකරණය මත රඳා පවතී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ණය සහ ණයට ගැනීම්

මූලික හඳුනාගැනීමෙන් පසු පොලියක් දරන ණය සහ ණයට ගැනීම්, සඵල පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ක්‍රියාවලිය මඟින් වගකීම් හඳුනා නොගත්විට වාසි සහ අවාසි, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

පවරාගැනීමක් මත යම් වට්ටමක් හෝ වාරිකයක් හෝ සඵල පොලී අනුපාතය හා සම්බන්ධිත කොටසක් ලෙස සලකන ගාස්තු හා පිරිවැය ගණන් ගෙන, ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ ඇතුළත් කරයි.

හඳුනාගැනීම ඉවත්කිරීම

වගකීමක් යටතේ වූ බැඳීම නිදහස් කළහොත් හෝ අවලංගු කළහොත් හෝ කල් ඉකුත් වුවහොත් එම මූල්‍ය වගකීම හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එම ණය දෙන්නා සමඟම සැළකිය යුතු වෙනස් වූ කොන්දේසි මත වෙනත් එකක් ප්‍රතිෂ්ඨාපනය කළහොත් හෝ පවත්නා කොන්දේසි සැළකිය යුතු ලෙස තව්කරණය කළහොත්, එවැනි හුවමාරුවක් හෝ තව්කරණයක්, මුල් වගකීම හඳුනාගැනීම ඉවත් කිරීමක් ලෙස සළකා නව වගකීම හඳුනාගනී. අදාළ ධාරණ වටිනාකමෙහි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

2.2.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලට අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු ඇතුළත්වන අතර, ඒවා ඕනෑම වේලාවක දන්නා මුදල් බවට පරිවර්තනය කළ හැකි අතර, ඒවා වටිනාකමෙහි වෙනස්වීමක් පිළිබඳ වැදගත් අවදානමකට යටත් නොවේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට පහත සඳහන් දෑ අතුළත්ය. අතැති මුදල්, බැංකු තැන්පතු, හිඟ බැංකු අයිරාවල ශුද්ධ වටිනාකම

2.2.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

හානිවීම සඳහා යම් ඇඟවීමක් තිබේදැයි තීරණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගමේ වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබුණහොත්, වත්කමේ අයවිය යුතු මුදල ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක අයකරගත හැකි මුදල් හෝ මුදල් උපයන ඒකකය වන්නේ, එය භාවිතයේදී පවතින අගය සහ විකිණීමට දරන පිරිවැය අඩුකළ විට එහි සාධාරණ අගය යන දෙකින් වැඩි අගයයි. භාවිත කරන වටිනාකම තක්සේරු කිරීමේදී බදුවලට පෙර වට්ටම් අනුපාතය යොදාගෙන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායෙහි වර්තමාන අගයන්ට වට්ටම් කරනු ලැබේ. එයින් මුදලේ වර්තමාන තක්සේරු වටිනාකම සහ එම වත්කමට නිශ්චිත අවදානම පිළිබිඹු වේ. මුදල් උපයන ඒකකය වන්නේ, වෙනත් වත්කම් සහ කාණ්ඩවලින් බොහෝදුරට නිදහස් මුදල් ප්‍රවාහයන් උපයන හඳුනාගත හැකි කුඩාම වත්කම් කාණ්ඩයයි.

වත්කමක ධාරණ වටිනාකම හෝ එකී මුදල් උපයන ඒකකය එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ පාඩුවක් හඳුනා ගනී. හානිකරණ පාඩු, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. මුදල් උපයන ඒකකයක හානිකරණ පාඩුවක් හඳුනාගත හොත්, පළමුව එකී ඒකකයට වෙන්කළ යම් කීර්තිනාමයක ධාරණ වටිනාකම අඩුකිරීමට සහ පසුව එම ඒකකයේ වෙනත් වත්කම්වල ධාරණ අගය අඩුකිරීම ප්‍රමාණානුකූල පදනමක් (pro rata basis) යටතේ සිදුකෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2.2.10 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම්, ඉල්ලූ විගස හෝ වාර්තාකරණ දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවීමට සිදුවන වගකීම් වන අතර, ජංගම නොවන වගකීම්, වාර්තාකරණ දිනෙන් වර්ෂයකට පසුව ගෙවීමට සිදුවන වගකීම් වේ.

සියලුම දන්නා වගකීම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන විට ගිණුම්ගත කරනු ලැබ ඇත.

2.2.10.1 සේවක ප්‍රතිලාභ

නිර්වචිත දායක සැලසුම්

නිර්වචිත දායක සැලැස්මක්, පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර, ඒ යටතේ එක් ආස්ථිත්වයක් වෙනත් ආස්ථිත්වයකට ස්ථිර දායක මුදල් ගෙවන අතර, ඉන්පසු තවදුරටත් මුදල් ගෙවීමට කිසිදු නෛතික හෝ ගිණුම්ගත සවිමත් බැඳීමක් නැත. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සියලුම සේවකයින් ආවරණය වන පරිදි කෙරෙන දායක මුදල් වගකීම, එය දැරූ විට ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගැනේ.

සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක කෙරේ.

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැර පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මක් වේ. නිර්වචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ ස්වාධීන ආයුගණකවරුන් විසිනි. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙන් වර්තමාන අගය නිශ්චය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයට නම්කරන ලද පොලී අනුපාතයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායෑම් වට්ටම් කිරීමෙනි. ඒ සඳහා අදාළ වගකීමෙහි කාලසීමාවන් ආසන්න කරමින් කල්පිරීමට කාලසීමාවන් පවතී.

නිර්වචිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම, උපකල්පන රාශියක් භාවිත කරමින් ආයුගණක පදනමකින් නිශ්චය කරන ලද සාධක රාශියක් මත පදනම් වේ. නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිශ්චය කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන උපකල්පන සටහන 19.1 හි සඳහන් වේ එකී උපකල්පනවලට අනුව කරනු ලබන වෙනස්කිරීම්, නිර්වචිත ප්‍රතිලාභ වගකීම්වල ධාරණ වටිනාකමට බලපායි.

නිර්වචිත ප්‍රතිලාභ වගකීම් සඳහා ආයුගණක වාසි හෝ අවාසි, ඒවා සිදුවූ කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගැනේ. එවැනි ආයුගණක වාසි හෝ අවාසි ද වහාම රඳවාගත් ඉපැයීම්වලට හඳුනාගත්නා අතර, පසු කාලපරිච්ඡේදයන් සඳහා ලාභ හෝ අලාභයන්ට යළි වර්ගීකරණය කරනු නොලැබේ.

විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයින්ගේ පළමු සේවා වර්ෂයේ සිට කරනු ලැබ තිබේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, සේවකයෙකුගේ වගකීම පැනනඟින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් පසුවයි.

වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් සම්පාදනය නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

කෙටිකාලීන ප්‍රතිලාභ

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වගකීම්, වර්ථමාන නොකළ පදනමට මනිනු ලබන අතර, අදාල සේවා කාලයට කරන ලද ප්‍රතිපාදනය වියදමක් සේ සළකයි.

2.2.10.2 රජයේ ප්‍රදාන

2011 අංක 43 දරන ආදායම් බදු පනතේ ක්‍රියාකාරී ව්‍යවසායන් හා ආදායම් උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත බලාත්මක වීමත් සමඟ, අත්පත් කරගත් ශුද්ධ වත්කම්වලින් සමන්විත ශේෂ පත්‍රය තුළ රජයේ ප්‍රදාන පිළිබිඹු වේ. පසුව, එකී ආස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා කාරක ප්‍රාග්ධනය සපයන ලදී.

2.2.10.3 ප්‍රතිපාදන

ඉකුත් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතොත්, ප්‍රතිපාදනයක් හඳුනාගනී. සමාගමට දැනට නෛතික හා සවිමත් වගකීමක් ඇති අතර, එය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිය. එමෙන්ම, ආර්ථික ප්‍රතිලාභවල සම්පත් පිටතට ගලායාමක් අන්තර්ගතව ඇති බවට සම්භාවිතාවක් ඇති නිසා වගකීම නිරවුල් කිරීම අවශ්‍ය විය හැක.

2.2.11 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය සමඟ අනුකූල වේ.

2.3 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිත කිරීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට සටහන් කරන ලද ආදායම්, වියදම්, වත්කම්, වගකීම් හා අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම්වලට බලපාන විනිශ්චයන්, ඇලපීම්, ඇස්තමේන්තු හා උපකල්පන කිරීමට කළමනාකාරිත්වයට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එවැනි උපකල්පන හා ඇස්මේන්තුවලට අවිනිශ්චිතතාවේ ප්‍රතිඵල හේතුවෙන් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවිය හැකිය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීමේදී අවස්ථාවෝචිතව සාධාරණ යැයි විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළුව ඓතිහාසික පළපුරුද්ද හා වෙනත් සාධක පදනම් වේ. එබැවින්, තථ්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල එම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා සඳහන් කළ උපකල්පන කෙරීගෙන යන පදනමින් සමාලෝචනය කෙරේ. සංශෝධන එම කාලපරිච්ඡේදයට හා යම් අනාගත කාලපරිච්ඡේදයකට පමණක් බලපායි නම්, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කරන සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හඳුනා ගනු ලැබේ.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම් ක්‍රියාවලියේදී, අනාගතයට අදාළව කරන ලද ප්‍රධාන උපකල්පන සහ වාර්තාකරණ දිනට ඇස්තමේන්තු ප්‍රභවයන් සහ ඊළඟ වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට හේතුවන වැදගත් අවදානමක් ඇති අදාළ ගැලපුම් පහතින් සාකච්ඡා කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක ධාරණ වටිනාකම, එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවන විට සහ එහි සාධාරණ වටිනාකමින් විකිණීමට දැරූ පිරිවැය අඩුකොට සහ එහි භාවිත වන වටිනාකම යන අගයෙන් වැඩි අගයක් ඇතිවිට හානිකරණයක් පවතී. විකිණීමට දැරූ පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම ගණනය කිරීමට පදනම් වන්නේ සමාන වත්කම්වල තමාගේ ප්‍රයෝජනය තකා කරගන්නා (Arm's length transactions) අනුගම්‍ය විකුණුම් ගණුදෙනුවලින් පවත්නා දත්ත හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපල වටිනාකමින් වත්කම් අපහරණය කිරීමට දැරූ පිරිවැය අඩුකළ වටිනාකම මතයි. භාවිත කරන වටිනාකම ගණනය කිරීමට පදනම් වන්නේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමයයි. තක්සේරු කිරීමේ කාර්යය සඳහා භාවිත කරන වර්ධන අනුපාතය සහ අපේක්ෂිත අනාගත මුදල් ගලාඒම් මෙන්ම අයවිය යුතු මුදල්, වට්ටම් කළ මුදල් ප්‍රවාහ මාදිලිය සඳහා භාවිත කළ වට්ටම් අනුපාතයට වඩාත් සංවේදී වේ.

දේපල, පිරියත හා උපකරණ ක්ෂය

දේපල, පිරියත හා උපකරණවල ආර්ථික ආයු කාලය සහ අවශේෂ වටිනාකම අපේක්ෂිත වත්කම් පාවිච්චි කරන කාලය සහ එකී වත්කම්වල ඵලදායී ආයුකාලය පදනම් කරගෙන කළමනාකාරිත්වය නියම කරයි. තාක්ෂණික දියුණුව හෝ වත්කම් භාවිතය වැනි අවස්ථාවල පසුව කරනු ලබන වෙනස්වීම් හේතුකොට ගෙන තථ්‍ය ඵලදායී ආයුකාලය හෝ අවශේෂ වටිනාකම මුල් ඇස්තමේන්තුවෙන් වෙනස් වේ. දේපල, පිරියත හා උපකරණවල ප්‍රධාන අයිතමයන්වල අවශේෂ වටිනාකම සහ ඵලදායී ආයුකාලය කළමනාකාරිත්වය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ.

ලැබිය යුතු දෑ හානිකරණය

සමාගම සෑම වාර්තාකරණ දිනකම යම්කිසි දීමනාවක් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කළ යුතුද යන්න තක්සේරු කිරීම සඳහා සියලුම ලැබිය යුතු දෑ සමාලෝචනය කරයි. හිඟ මුදල්වල කාලසීමාව සහ අයකර ගැනීම අවිනිශ්චිත බවට කළමනාකාරිත්වය දැනුවත් බව ඇඟවීම වැනි වෙනත් සාධකද සැළකිල්ලට ගනිමින් එවැනි දීමනාවක් ඇස්තමේන්තු කිරීමට කළමනාකාරිත්වය විනිශ්චයක් භාවිත කරයි.

3. නිකුත් කළ නමුත් තවම බල නොපැවැත්වෙන ප්‍රමිතීන්

ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9 (SLFRS 9) - මූල්‍ය සාධන පත්‍ර

දැනට පවතින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) - මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම හා මැනීම යටතේ ඇති මාර්ගෝපදේශ වෙනුවට ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9 ප්‍රතිස්ථාපනය කර ඇත. ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9 හි පහත සඳහන් දෑ සඳහා සංශෝධිත මාර්ගෝපදේශ ඇතුළත් වේ. එනම්, මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය හා මැනීම, මූල්‍ය වත්කම් හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු මාදිලිය සහ නව පොදු ඉදිරිරැකුම් ගිණුම්කරණ අවශ්‍යතා.

තවද, එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි සඳහන් මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම හා හඳුනාගැනීම ඉවත්කිරීම සඳහා වූ මාර්ගෝපදේශ තවදුරටත් ඉදිරියට ගෙන යයි.

ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9, 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර, ඊට පෙර භාවිත කිරීමටද අවසර ලබා දේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 15 (SLFRS 15) - ගණුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් උපයන ආදායම

කොපමණ ප්‍රමාණයකින් කවදා ආදායම හඳුනා ගත්නවාද යන්න තීන්දුවය කිරීමට ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 15 මඟින් විස්තීර්ණ රාමුවක් ස්ථාපිත කරයි. එය, ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 18 අයහාර, ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ IFRIC 13 - පාරිභෝගික පක්ෂපාතීත්ව වැඩසටහන් (Customer loyalty programmes) ඇතුළත් දැනට පවතින අයහාර හඳුනාගැනීමේ මාර්ගෝපදේශය වෙනුවට ප්‍රතිස්ථාපනය කර ඇත.

විස්තරාත්මක බලපෑම් විශ්ලේෂණය තවම නිමවී නොමැති බැවින්, ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9 (SLFRS 9) සහ ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 15 (SLFRS 15) වලින් ඇතිවිය හැකි බලපෑම වාර්තාකරණ දිනට සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

පහත සඳහන් සංශෝධන සහ වැඩිදියුණු කිරීම් මඟින් සමාගමේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කෙරෙතැයි අපේක්ෂා නොකෙරේ.

- බද්ධ මෙහෙයුම්වල අයිතිය අත්කර ගැනීම් සඳහා ගිණුම්කරණය (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 11 සඳහා සංශෝධන)
- ක්ෂය හා ක්‍රමක්ෂය සම්බන්ධයෙන් පිළිගත හැකි ක්‍රම පැහැදිලි කිරීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 38 සඳහා සංශෝධන)
- වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශවල ස්කන්ධ ක්‍රමය (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 27 සඳහා සංශෝධන)
- ආයෝජකයෙකු සහ එහි ආශ්‍රිතයා හෝ බද්ධ ව්‍යාපාරයක් අතර වත්කම් විකිණීම හෝ බෙදාහැරීම (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 10 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 28 සඳහා සංශෝධන)
- ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 2012 - 2014 චක්‍රය සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම් - විවිධ ප්‍රමිත
- ආයෝජන ආස්ථිත්ථ්‍යයන් : ඒකාබද්ධ ව්‍යතිරේඛය යොදාගැනීම (ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 10, ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 12 සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 28 සඳහා සංශෝධන)
- හෙළිදරව් කිරීමේ මූලපිරීම (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 සඳහා සංශෝධන)

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

4 ආදායම	2017	2016
	රු.	රු.
4.1 සාරාංශය		
භාණ්ඩ විකුණුම්	7,616,939,721	7,728,890,324
	7,616,939,721	7,728,890,324
4.2 ආදායම් පහත පරිදි උපයාගෙන ඇත		
සීනි	4,637,042,513	4,059,937,569
මොලැෂස්	987,750	738,750
ENA නිෂ්පාදන	2,978,909,458	3,668,214,005
	7,616,939,721	7,728,890,324

ඛණ්ඩ තොරතුරු

	ප්‍රධාන කාර්යාලය	පැල්වත්ත අංශය	සෙවනගල අංශය	ඉවත් කිරීම	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
ඛණ්ඩ ආදායම	58,811,953	4,706,938,137	2,910,001,583	(58,811,953)	7,616,939,721
ඛණ්ඩ ප්‍රතිඵල					
දළ ලාභය/ (අලාභය)	58,811,953	373,404,840	1,140,838,897	(58,811,953)	1,514,243,737
වෙනත්					
ප්‍රාග්ධන වියදම්	1,144,461	75,383,798	56,691,339	-	133,219,598
ක්ෂය වීම	3,230,529	232,284,484	116,925,178	-	352,440,192
ඛණ්ඩ වත්කම්					
ජංගම නොවන වත්කම්	7,117,715	1,725,673,089	470,464,640	-	2,203,255,444
ජංගම වත්කම්	184,989,984	3,151,526,160	2,380,356,715	(515,252,025)	5,201,620,835
ඛණ්ඩ වගකීම්					
ජංගම නොවන වගකීම්	-	494,651,006	162,083,310	-	656,734,317
ජංගම වගකීම්	183,314,224	1,479,540,931	574,813,765	(515,252,025)	1,719,416,895

5 වෙනත් ආදායම් සහ ලාභ	2017	2016
	රු.	රු.
වෙනත් සේවා ආදායම්	16,004,000	40,274,918
විවිධ ආදායම්	31,853,289	30,028,563
	-	-
	47,857,289	70,303,481

6 මූල්‍ය පිරිවැය සහ ආදායම්

	2017	2016
6.1 මූල්‍ය පිරිවැය	රු.	රු.
බැංකු ණය මත පොලී වියදම්	32,358,024	13,955,202
බැංකු අයිරා මත පොලී වියදම්	80,584,514	49,837,683
කල්බදු වගකීම් මත මූල්‍ය ගාස්තු	7,562,267	8,199,309
ස්ථාවර වත්කම් අපහරණය මත අලාභය	40,323	100,081
	120,545,127	72,092,275
6.2 මූල්‍ය ආදායම්		
ගොවීන්ගෙන් අයවිය යුතු ණය මත පොලී ආදායම්	57,319,129	61,600,660
ස්ථාවර තැන්පතු මත පොලී ආදායම්	163,205,749	89,538,596
වෙනත් පොලී ආදායම්	-	328,115
	220,524,878	151,467,371

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

7 බදුවලට පෙර ලාභය

අයකිරීමෙන් පසු ප්‍රකාශිත	2017 රු.	2016 රු.
විකුණුම් පිරිවැය තුළ ඇතුලත්		
සේවක ප්‍රතිලාභවලට පහත සඳහන් දෑ ඇතුළත්ය.		
නිශ්චිත දායක සැලසුම් පිරිවැය - සේ.අ.අ. සහ සේ.භා.අ.	178,685,022	176,489,982
ක්ෂයවීම්	292,408,578	270,717,322
පරිපාලන වියදම් තුළ ඇතුළත්		
සේවක ප්‍රතිලාභවලට පහත සඳහන් දෑ ඇතුළත්ය.		
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	71,127,491	36,000,000
නිශ්චිත දායක සැලසුම් පිරිවැය - සේ.අ.අ. සහ සේ.භා.අ.	50,087,154	47,455,070
ක්ෂයවීම්	59,634,601	51,075,025
විගණන ගාස්තු	850,000	850,000
ගොවි ණය සඳහා බොල් ණය	62,228,740	33,425,595

8

	2017 රු.	2016 රු.
ප්‍රවර්තන ආදායම් බදු	54,319,043	183,699,514
විලම්බිත බදු ගාස්තු/ (ප්‍රත්‍යාවර්තනය) (සටහන 8.2)	220,724,279	-6,649,239
	275,043,322	177,050,275

8.1 ප්‍රවර්තන බදු වියදම්/ (ආදායම්) සහ ගිණුම්කරණ ලාභ/ (අලාභ) නිමැවුම් අතර සැසඳීම

බදුවලට පෙර ගිණුම්කරණ ලාභය/ (අලාභය)	402,703,163	1,006,287,730
පෙර වර්ෂයේ ලාභ සඳහා ගැලපුම්	-	(1000)
බදුවලට පෙර ගැලපූ ගිණුම්කරණ ලාභය/ (අලාභය)	402,703,163	1,006,286,730
සමස්ථ ඉඩනොදුන් අයිතම	436,847,073	404,493,267
සමස්ථ ඉඩදුන් අයිතම	(363,677,132)	(488,654,435)
පෙර වර්ෂයේ ලාභ සඳහා ගැලපුම්		
බදු කාර්යය සඳහා ව්‍යාපාරික ලාභය/ (අලාභය)	475,873,104	922,125,562
බද්දට යටත් වන වෙනත් ආදායම් ප්‍රභවයන්		
පොලී ආදායම	220,524,878	89,538,596
තක්සේරු කළ හැකි මුළු ආදායම	696,397,982	1,011,664,158
වර්ෂය තුළ උපයෝජනය කළ බදු අලාභ	(243,739,294)	(355,594,467)
බදු අයකළ හැකි ආදායම	452,658,688	656,069,692
12% බැගින් ආදායම් බදු	54,319,043	183,699,514
ඉදිරියට ගෙනා බදු අලාභ	926,202,880	1,281,797,347
වර්ෂය තුළ සිදු වූ බදු අලාභ	434,310,991	-
වර්ෂය තුළ උපයෝජනය කළ බදු අලාභ	(400,106,947)	(355,594,467)
ඉදිරියට ගෙන ගිය බදු අලාභ	**960,406,925**	**926,202,880**

8.2 විලම්බිත බදු වත්කම්

	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 2017 රු.	2016 රු.	ලාභාලාභ ප්‍රකාශය 2017 රු.	2016 රු.
විලම්බිත බදු වගකීම				
දේපල, පිරියත හා උපකරණ මත	(311,909,307)	(37,040,188)	(274,869,119)	(5,280,730)
	(311,909,307)	(37,040,188)	(274,869,119)	(5,280,730)
විලම්බිත බදු වත්කම්				
දේපල, පිරියත හා උපකරණ මත	-	-	-	-
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත	183,352,056	129,207,216	54,144,840	11,929,969
	183,352,056	129,207,216	54,144,840	11,929,969
			(220,724,279)	6,649,239
විලම්බිත ආදායම් බදු ආපසු හැරවීම	-			
ශුද්ධ විලම්බිත බදු වත්කම/ (වගකීම)	(128,557,251)	92,167,028		

9 කොටසක ඉපැයුම්/ (අලාභය)

9.1 කොටසක මූලික ඉපැයුම්/ (අලාභය) ගණනය කරනු ලබන්නේ වර්ෂය තුළ හිඟව පවත්නා සාමාන්‍ය කොටස්වල හරිත සාමාන්‍ය සංඛ්‍යාවෙන් කොටස් හිමියන්ට ආරෝපණය කළ වර්ෂය සඳහා වන ශුද්ධ ලාභය/ (අලාභය) බෙදීමෙන්ය.

9.2 ලවය ලෙස භාවිත කළ මුදල

	2017 රු.	2016 රු.
කොටසක ඉපැයුම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ ශුද්ධ ලාභය/ (අලාභය)	127,659,841	829,237,456

හරය ලෙස භාවිත කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව

	2017	2016
කොටසක මූලික ඉපැයුම්/ (අලාභය) සඳහා අදාල සාමාන්‍ය කොටස්වල හරිත සාමාන්‍ය සංඛ්‍යාව	100	100

10 දේපල, පිරියත හා උපකරණ

10.1 ඉදිරියට ගෙන යන දළ අගයන්

	2017.01.01 දිනට ශේෂය	එකතු කිරීම්/ මාරු කිරීම්	අපහරණයන්/ මාරුකිරීම්	2017.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
ඉඩම්	44,149,728	-	-	44,149,728
ඉඩම් සංවර්ධනය	165,206,052	-	-	165,206,052
කර්මාන්තශාලා ගොඩනැගිලි	241,393,459	2,971,321	-	244,364,780
වෙනත් ගොඩනැගිලි	229,159,601	-	-	229,159,601
ක්ෂේත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	415,045,104	9,865,741	-	424,910,845
වාරිමාර්ග සහ විවිධ උපකරණ	195,178,651	12,026,894	-	207,205,545
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	2,728,688,860	51,251,145	-	2,779,940,005
වෙනත් පිරියත හා උපකරණ	118,798,403	34,360,000	-	153,158,403
ගබඩා වැංකි	63,398,475	-	-	63,398,475
මාර්ග සහ පාලම්	111,179,516	-	-	111,179,516
රසායනාගාර උපකරණ	49,291,526	-	-	49,291,526
මෝටර් රථ	162,126,356	-	-	162,126,356
ලී බඩු, මෙවලම් සහ උපකරණ	170,605,731	12,918,800	(105,188)	183,419,343
ජනාවාස කලාප යටිතල පහසුකම්	73,193,739	-	-	73,193,739
	4,767,415,198	123,393,901	(105,188)	4,890,703,912
මූල්‍ය කල්බදු වත්කම්				
මෝටර් රථ	58,013,750	-	-	58,013,750
නිව් හොලන්ඩ් ට්‍රැක්ටරය	30,524,000	-	-	30,524,000
ක්ෂේත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	68,728,920	-	-	68,728,920
	157,266,670	-	-	157,266,670
කෙරිගෙන යන ඉදිකිරීම්				
ඉඩම් සංවර්ධනය	13,430,469	6,363,758	-	19,794,226
ගොඩනැගිලි - වෙනත්	4,945,067	2,286,120	(2,971,321)	4,259,866
මාර්ග සහ පාලම්	161,400	-	(161,400)	-
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	2,254,850	-	-	2,254,850
හෝටල් ව්‍යාපෘතිය	37,410,797	-	-	37,410,797
කොම්පෙන්සේටි යන්ත්‍රාගාරය	571,362	-	-	571,362
වාරිමාර්ග ව්‍යාපෘතිය/ නල ළිං	-	1,175,818	-	1,175,818
බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය	2,008,690	-	-	2,008,690
ජල පවිත්‍රාගාරය	27,067,811	-	-	27,067,811
	87,850,446	9,825,696	(3,132,721)	94,543,421
කෙරිගෙන යන ඉදිකිරීම් - මූල්‍ය කල්බදු මත				
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	120,750,000	-	-	120,750,000
	120,750,000	-	-	120,750,000
ඉදිරියට ගෙන යන මුළු දළ අගය	5,133,282,315	133,219,598	(3,237,909)	5,263,264,003

10.2 ක්ෂයවීම

	2017.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම	අපහරණයන්	2017.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
ඉඩම් සංවර්ධනය	64,099,936	3,471,804	-	67,571,740
කර්මාන්තශාලා ගොඩනැගිලි	141,527,604	5,340,525	-	146,868,129
වෙනත් ගොඩනැගිලි	117,376,984	4,873,918	-	122,250,902
ක්ෂේත්‍ර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	394,212,382	18,036,374	-	412,248,756
වාරිමාර්ග සහ විවිධ උපකරණ	144,879,583	6,130,858	-	151,010,441
කර්මාන්තශාලා පිරියත හා උපකරණ	1,251,828,220	227,859,709	-	1,479,687,929
වෙනත් පිරියත හා යන්ත්‍රසූත්‍ර	50,854,593	12,245,104	-	63,099,697
ගබඩා වැංකි	22,775,055	2,967,660	-	25,742,715
මාර්ග සහ පාලම්	100,935,019	1,601,454	-	102,536,473
රසායනාගාර උපකරණ	34,835,882	4,455,558	-	39,291,440
